

# ශබ්දවෘත්තිප්‍රකාශය.



# ශබ්දවෘත්තිප්‍රකාශය.

ආචාර්ය්‍යසද්ධම්මගරුනම්මහාස්ථවිරපාදයන්වහන්සේ
විසින්විරචිතයි.

වැලිතොට
විද්‍යාභාෂපරිවෙණාධිපති
අමරපුර ගණප්‍රධාන සංඝ නායක
ආචාර්ය්‍ය උත්තරධම්මහානිස්ස අරියවංසාලඞ්කාර
ඤාණතිලකනායකස්ථවිරපාදයන්වහන්සේ
විසින්
ලියනලදවිස්තරව්‍යාඛ්‍යානිකයි.

නෙක ශ්‍රීය්විරාජමානවූ
ගරුතර
සර් ඇඩ්වඩ් නෝල්වෝකර් කේ. සී. ඇම්. ජී.
ලඞ්කාණ්ඩුකාරඋතුමානන්වහන්සේවිසින්
අතිශයසමාදරයෙන්පිළිගන්නාලදී.

ඔබිනාමූනි කරණේරිස්ද සිල්වා වෛද්‍යක
ඩී සිසිලියස්ද සිල්වාමුනින්ද්‍රදාස
යන අප විසින්
වැලිතොට
විද්‍යාරත්නාකරයන්ත්‍රයෙහි
මුද්‍රණය කරවනලදී.

ශ්‍රී.බු.ව. 2442.

1899.

අමරපුර ගණප්‍රධාන සංඝනායක පු. ඒ. ඤාණතිලක
නායකස්ථවිරයන්වහන්සේ



"HIS HOLINESS"
Amarapuraganapradhana Sanghanayaka
P. A. NANATILAKA HIGH PRIEST.

# SABDHAVURTTIYA

COMPOSED BY THE

*SADHAMMAGARU MAHA SAMI*

*TOGETHER WITH SINHALESE*

*pharaphrase by the*

*amarapura ganapradhana sanghanayaka*

*U. A. NANATILAKA*

HIGH PRIEST

THANKFULLY

*ACCEpTED BY H . E SIRE. E. NOIL WALKER.*

K. C. M. G.

*GOVERNOR OF CEYLON*

*Published By*

*O. k. D. Silva* and *T. C. D. S. Munindradasa*

**PRINTED AT THE**

VIDYARATNAKARA PRESS

**WELITERA**

*1899*

නෛකශ්‍රීන් විරාජමානවූ

ගරුතර

**සර් ඇඩ්වඩ් නෝල්වෝකර් කේ. සී. ඇම්. ජී.**

ලඞ්කාණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින්

**මෙම ශබ්දධාතු ප්‍රකාශය**

අතිශය ගෞරව කිරීමෙන්

පිළිගන්නාලදී

# සංඥාපනය.

**ශබ්දවෘත්තිප්‍රකාශක**—මේ මාගධී ව්‍යාකරණ ග්‍රන්ථය **තාම්බද්වීප රටේ විජය** පුරයෙහි වැඩිවිසූ **සද්ධම්ම** ගුරු නම් මහාස්ථවිරයන්වහන් සේවිසින් අන්‍යතරස්ථවිරතුමෙකුන්ගේ ඇරයුමෙන් රචනාකර ණලද්දේයි—

මේ ස්ථවිරෝත්තමයෝ මාගධී සංස්කෘතාදි නානාභාෂාවින්හිද තර්කව්‍යාකරණ ඡන්දෝලඞ්කාරාදි අනෙකශාස්ත්‍රයන්හිද ඉතාදක්ෂ වූහෝයි—

මෙය බුද්ධවර්ෂ **2200** වැන්නෙහි සාදනලද බවහැඟේ.

**කච්චායනටීකාදි** ග්‍රන්ථවලට මේ ග්‍රන්ථයෙහි ගාථා ගෙණ තිබෙන බැවින් ඒ ග්‍රන්ථවලට පූර්වයෙහි කරණලදබැව් කියහැක්කේයි—

මෙහි ජාතිගුණක්‍රියා ද්‍රව්‍ය නාම යන පඤ්චවිධ ශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තනද ස්වාර්ථ ද්‍රව්‍ය ලිඞ්ග සංඛ්‍යා කාරකවශයෙන් හෙළවන ප ර්ථද කර්මකර්ත්‍රාදි අනෙකප්‍රකාර මාචත්‍යද චිතිසාදි දශවිධ වාච්‍යයද ඉතාවිස්තරලෙස දක්වනලද්දේයි—ජාත්‍යාදි ශබ්දපඤ්චකයාගේ විශේෂ විභාගාදියහා ස්වාර්ථාදීන්ගේ විස්තර විභාගයද දැනගැන්මට ඉවහල්වූ මේතරම් ප්‍රයොජන අන්‍යග්‍රන්ථයන් අපවිසින් නොදක්නා ලද්දේයි—ජාත්‍යාදි ශබ්දපඤ්චකය උගන්වනු පිණිස තර්කශාස්ත්‍රයෙන්ද ඇතම් කාරණා මෙහිගෙණහැර දක්වනලද්දේයි—

මෙහි පරිච්ඡෙද විභාගයක් නැතිනුමුත් ගාථා **114** කින් සමන්විත යුක්තවූයේයි—අන්‍යප්‍රකරණයන්හි **සද්දවුත්ති** යන නාමය මෙයට ව්‍යවහාර කරණලදනුමුත් මෙහිදු **සද්දවුත්තිප්පකාසක** කියා දක්වනලද්දේයි—

මෙය උද්ග්‍රහණ ධාරණයකිරීමෙන් මාගධීව්‍යාකරණයෙහි අතිශය ප්‍රාණිධ්‍යයක් ලැබියහැක්කේයි—මෙයින්අභිධර්මාදි ගම්භීරදුර්බොධස්ථානද දතහැකිවන්නේයි—මේග්‍රන්ථය බුරුමරටේ උගත්ශු ශිෂ්‍යයන්ට බොහොසේ ප්‍රගුණකරවති-ව්‍යාකරණ උගන්වනු ලබන දශවිධ ග්‍රන්ථයන්ට මෙයද ඇතුළත් කරණලද්දේයි—මේග්‍රන්ථයාගේ අගය ලක්වැස්සන්ට මෙතාක්මවැටහී නොමැත්තේයි-එබැවින්ශිෂ්‍යයයාට මෙසඳපුරුණුනොකරවති-සැබවින්ම මෙය නොදතුවන්ට ජාත්‍ය

දීඝබිඳු පඤ්චකය දුගගැන්ම නොහැකිමවින්නේමි-මේග්‍රන්ථයෙද ඇතැම් ආචාර්ය්‍ය පරම්පරාවල රහස්‍යභාව ශිෂ්‍යයන්ට උගන්වනු ලබින්නේයි-ඒ ඉගෙණගනු ලබන්නන්හුද විශ්වාසත් විශේෂව්‍යාකරණ පද්‍යඛ්‍යයක් පවින්නේයි—එබැවින් මාගධීව්‍යාකරණ ඉගෙණීමෙහි අභිලාෂ ඇත්තාවූන්ගේ අභිවෘද්ධියපිණිස මේ ව්‍යාඛ්‍යාව ප්‍රකාශ්‍යකාරලෙස ලියන ලද්දේයි-මෙහිදු අගය පොතවිලන්නවුන්ට නිරායාසයෙන් හැඟියන බැවින් ඒ සඳහා මෙහිදී යමක් නොකීවමු.

මෙලෙව්හි ප්‍රකාශිත නිර්දෝෂමුද්‍ද සනෑව්‍යදසෙළුම් යොදුනු ලබන්නෝ සත්‍ය දර්ශිවූ තද්ගනොතනමයෝයි—

ඒ උතුමන්ගේ රචනාවලවාදවා ර්‍ෂ්‍යභිමාහත්‍රාපිතවූ මිට්ටසඳ ක්‍රිකාජ්තපරාවෝ දෙමදක්වති ශ්‍රේද ප්‍රොකඩම්ජෝකි—

අසිද්ධ. කිසිසේත් සියල්ලෙහි තත්වයදහුවෝ නොවෙමු—අනාගත කෙලසුරශිෂ්‍යගේ පරිඥනයෙන් දනුද්බන්නෝද වෙමු—එබැවින් ප්‍රමාදමතිහුම්ාදිනොයෙක් දෙදෙ අපගෙන්වියහැක්කේයි—

සෙංනලීය ඇතම් දුර්විදග්ධයෝ ඊෂ්‍යා පරවශවීමෙන් දෝෂනෝ නොහොත් අපරිඥානයෙන් දෝනෝ විදග්ධවූ ග්‍රන්ථකර්තෘවරුන්ම ඔින් රචනාකරණලද රචනාවලමිහිහුමාදියෙන් ජනිත සියගණන් දෙස්හිබිඳුදි නිර්දෙෂණාන දෙෂසථානමෙන් ගෙණ ප්‍රකාශ කරති—එසිනුදු ඒ රචනාවල ගුණ දෙදයන්ගේ ස්වභාව වෙනස්විමටද ග්‍රන්ථගෞරවයට·හා ග්‍රන්ථපූර්ණයටද හේතු නොවේ—

එසේම අපගේ ප්‍රමාදාදියෙන් ජනිනදෝෂාංකුවකුදු මෙහි නොමැතියයි නොකියමු, එහිදු නිර්දෝෂාපිය ඊෂ්‍යාහසිකාර පරවශනුවූ සජ්ජනාභිලාෂි සුවිදග්ධ ජනනාවට භාරවේවයි අපගේ යාචනායි—

# ශුද්ධිපත්‍රය.

—*—

| පිට | පෙල | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| 4 | 3 | අභිනා | අභිතා |
| ,, | 20 | වඥෙනි | වඥැන් |
| 5 | 16 | පාපාදිකො | පාථාදිකො |
| 6 | 4 | අනන්තවාසී | අනතාසී—වෙනත් |
| 7 | 17 | මූභානි | මූඨානි. |
| 12 | 9 | අභිවාදිය | අභිවන්දිය—වෙනත් |
| ,, | 25 | "මේපෙලේමුලට—අභිවන්දියතෙනිවා අභිවන්දිය" | |
| 14 | 31 | ආචිකී. | ආචායකී. |
| 5 | 20 | අධාරයනම් | ආධාරයනම් |
| 18 | 14 15 | සඥැනි | සපපනි |
| ,, | 17 | සපපනි | සඥැති |
| 21 | 11 | පුඹු | පඤ්ච |
| ,, | 27 | නිදගිනයි | නිදඝිනයි |
| 22 | 20 | කොලිතො | කොලිත |
| 23 | 2 | දෙවොච | දෙවොච |
| 24 | 30 | ඣජ්කො | භුඣ්ජ්කො |
| 25 | 16 | මෙසේයි. | එසේයි |
| 29 | 27 | රූපය | සරූපය—වෙනත් |
| 30 | 31 | කිකල්හිආනනැනට—ක්‍රියායනූ,ක්‍රියාවගේවනාශි | |
| ,, | 22 | සූතකශබ්දයන්ජිසින් | සූතකශබ්දයවිසින් |
| 31 | 28 | යවිසි | යවිසිං. |
| 36 | 7 | ඥානයෙනි | ඥානයන්අතුරෙන් |
| ,, | 14 | පඨමං | තාව. |
| 47 | 9 | වෑඩාදි | වෑබ්‍යාදි |
| ,, | 22 | කිංඅත්ථා, | කිංඅත්ථංඑව |
| ,, | 23 | අයිධියක් | අයිධියක්ම |
| ,, | 30 | ජාතිය | ජාතියයි |
| 43 | 12 | එසේහෙයින් | තමෙ, එසේහෙයින් |
| 52 | 5 | පච්ඡුච්චාරිත | පච්ඡුච්චාරිත—වෙනත් |
| ,, | 29 | සරූපකං | සරූපකෙ |
| 59 | 30 | ඤකාරසී | ඤකාරාසී |

# ශුද්ධිපත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
| --- | --- | --- | --- |
| 57 | 7 | දන්නාලෑබෙද. | ගමෘතෙ,දන්නාලෑබේද |
| 61 | 27 | දනිතුසිගෙෝ, | වෙතුසිගෙෝ. |
| 62 | 19 | සම්බන්ධක | සම්බන්ධ |
| ,, | 20 | සම්පණ්ඩ | සම්බන්නා |
| 63 | 20 | ඒසෙසසනා | ඒසෙසසනා. |
| 65 | 18 | පාචිකසඞ්ඝක, | පාකසඞ්ඝත--චෙනත් |
| ,, | ,, | පුචිත්‍රනිර්මි | පුචිත්‍රනිර්මිතා |
| 33 | ගාථාවේ | වී. ජේ. ඩී. | ඩී. ජී. ඩී |

## අමරපුර ගණප්‍රධාන සංඝ නායක
## පූජ්‍ය ඊ. ඤාණතිලක නායක ස්ථවිරයන් වහන්සේ
## විසින් වයස 31 සිට 35 දක්වා කරනලද ග්‍රන්ථ

මුඛමත්තදීපනී විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ) සර් ජෝසෆ් වෙස්ට් රිජ්වේ ලංකාණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින් (පිළිගන්නාලදී)

2 කාරිකා විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ) සියම්දේශාධිපති චූලාලංකාර සියම් මහාරාජොත්තමයන් විසින් (පිළිගන්නාලදී)

3 නිරුක්තිරත්නාකරය (පාලිව්‍යාකරණ-ගාථා 10000) සියම්දේශාධිපති චූලාලංකාර මහානරේන්ද්‍රයන් විසින් (පිළිගන්නාලදී)

4 ගන්ධාභරණ ව්‍යාඛ්‍යාව. ජේ. එච්. වෙස් [illegible] ඇත්තාන්සේ විසින් සමාදරයෙන් (පිළිගන්නාලදී)

5 ශබ්දවිනාසප්‍රකාශ ව්‍යාඛ්‍යාව- ශ්‍රීමත් ගරුතර ඇඩ්වඩ් නෝල්වෝර් ලංකාණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින් සමාදරයෙන් (පිළිගන්නාලදී)

6 එකක්ඛරකොසවිස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
7 කච්චායනසාර විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
8 ශබ්දබින්දු විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
9 නිරුක්තිසංග්‍රහ ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
10 වච්චවාචක විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
11 සංවණ්ණනානයදීපනී විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
12 වාචකොපදෙශ විස්තර ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
13 විභත්‍යත්ථදීපනී ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
44 ගන්ධට්ඨී ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
15 ශාසනවංසදීප විස්තර ව්‍යාඛ්‍යාව (පාලි ශාසනේතිහාසික කාව්‍ය)
16 විදග්ධමුඛමණ්ඩන ව්‍යාඛ්‍යාව (සංස්කෘතකාව්‍ය)
17 ශෘඞ්ගාරතිලක විස්තර ව්‍යාඛ්‍යාව (සංස්කෘතකාව්‍ය)
18 මෝහමුද්ගාර ව්‍යාඛ්‍යාව (සංස්කෘත—නීතිශාස්ත්‍ර)
19 අජීර්ණනිදාන ව්‍යාඛ්‍යාව (සංස්කෘත--වෛද්‍ය)

### උපයෝගිතාග්‍රන්ථ

1 කච්චායන සූත්‍රනිර්දෙශය (පාලිව්‍යාකරණ)
2 සූත්‍රනිපාතය (සම්බුද්ධධර්ම)
3 කාලවිධානපද්ධතිය (ජ්‍යොතිශ්ශාස්ත්‍ර)
4 පදභෙද ව්‍යාඛ්‍යාව (පාලිව්‍යාකරණ)
5 සාරසංග්‍රහ ව්‍යාඛ්‍යාව (ධර්මප්‍රකරණ)
6 සංයුක්තසඞ්ඛ්‍යා (සම්බුද්ධධර්ම)
7 සැයුත් අටුවාව (අට්ඨකථා)
8 දක්ෂිණ අමුවාසන්න (ධර්ම)
9 දසදහවස්තුප්‍රකරණය (ධර්මප්‍රකරණ)
10 බුද්ධවංශය (සිංහල ධර්ම)
11 සාමණේර බණදහම් පොත (සාමණේර ශික්ෂා)
12 සංසාරනිදාන (වෛද්‍ය)

**අමරපුර ගණප්‍රධාන සංඝ නායක**

පූ. ඒ. ඤාණතිලක නායක හිමිතුමන්වහන්සේවිසින්
කරණලද පාලිසංස්කෘත සිංහලපොත්වලින් දැනට
මුද්‍රණය කරණලදුව ප්‍රසිද්ධකරණලදපොත්.

1 මුඛමත්තදීපනී ව්‍යාඛ්‍යාව
2 ඒකක්ඛරකොස ව්‍යාඛ්‍යාව
3 සද්දබින්දු ව්‍යාඛ්‍යාව
4 කච්චායනසාර ව්‍යාඛ්‍යාව
5 කාරිකා ව්‍යාඛ්‍යාව
6 ශෘංගාරතිලක ව්‍යාඛ්‍යාව
7 ගන්ධාභරණ ව්‍යාඛ්‍යාව
8 සද්දවුත්ති ව්‍යාඛ්‍යාව
9 වච්චවාචක ව්‍යාඛ්‍යාව—

මේ පොත් පාලිව්‍යාකරණ ඉගෙණගන්නවුන්ට ඉතාප්‍රයෝජනයි සියුම් දුර්බොධස්ථාන දැනගැන්මට දැනට මුද්‍රිත පොත්අතරෙන් මේ පොත ඉතා ප්‍රකටයි— මේ පොත් වැලිතර විද්‍යාරත්නාකරයන්ත්‍රාලයේ උපකාලමනාකාර නැඹුපත් ජේ. ඒ. ඩී. මැන්දිස් අප්පුහාමි වන මගෙන්ද කොළඹ ගුණප්‍රකාශ යන්ත්‍රාලයෙන්ද මිනුවන්ගොඩ ඈම්. ඈම්. පී. විජේරත්නනුමාගේ පොත්ගෙයින්ද ඉල්ලනු

මෙයිට

**ජේ. ඒ ඩී මැන්දිස්**
විද්‍යාරත්නාකරයන්ත්‍රාලය
වැලිතර
කොස්ගොඩ

සන්න සහිත

# ශබ්දවෘත්තිප්‍රකාශය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

---

1 සම්බුද්ධ මුද්ධමාලොක යො, ගුණරංසි විරාජිතො
හිතුදයානන්ද ජනනො, තතමෙඝ ජලතං මම—

2 සද්ධම්ම මණිපජ්ජොතො, විජ්ජා තිමිර මුච්ඡිය
ධතලොකං ජනයං චෙතො, වරකෙ ජලතං මම—

3 විසුද්ධාරිය සංඝස්ස, වරවණ්ණරසො සුභො
රසනාය රසං සාධු, මාවහං ජලතං මම—

4 සික්ඛිසිං මං මහාථෙරො, **පදුමාරාම** නාමිකො
යො සුධී බුද්ධවචනෙ, සම්බුද්ධෙව ස මෙ ගරු—

5 තම්බදීපව්හයෙ රට්ඨෙ, විජයාඛ්‍ය පුරෙ වරෙ
**සද්ධම්මගරු** ථෙරො කා, **සද්දවුත්තිප්පකාසකං**—

6 **කාලතිත්ථ** පුරෙ රම්මෙ, **සුමිත්තාරාම** වාසිනා
මිත්තෙන **ධම්මසිරිනා**, ථෙරෙන අජ්ඣාචිතො—

7 තිස්සාය පාළ්‍යාලඞ්කාරං, නානා ගන්ථානමපිච
කරිස්ස මස්ස ගන්ථස්ස, සභාසාය පවණ්ණනං—

8 රසනා කුච්ඡිභාවීනං, ගන්ථ වණ්ණ විභාවනෙ
වෙඨිතා චොරු රස්මිං, රසනා න තථා සතං—

9 මතතා තොත්‍රු උස්සුයට්ටා, න හොන්ති කුච්ඡිභාවිනො
හොන්ති මතතාව සප්පඤ්ඤා, වණ්ණාවණ්ණවිභාවනෙ—

10 හෙස්සං යදහං සම්බුද්ධං, සබ්බඤ්ඤු පුණ්ණපාරමිං,
තදහං දෙසවිරහො, කා කථාවෙ ත් මනතරෙ—

1 අනන්තගුණං සම්බුද්ධං, සද්දවුත්තිප්පකාසකං
සද්ධම්මං රියසඞ්ඝඤ්ච, සක්කච්චං අභිවාදිය—

---

(ප්‍රකරණාරම්භයෙහි සකලාධ්‍යාත්මික බාහ්‍යොපද්‍රව නිවාරණයට සමර්ථවූ රත්නත්‍රයට ප්‍රණාමය කරන්නාවූ ප්‍රඥාවගේ ව්‍යක්තභාවය උපදවන්නාවූ භවත් “**සද්ධම්මගුරු**” නම්වූ ආචාර්යතෙමේ පළමු කොට ‘**අනන්තගුණං**’ යනාදී වාක්‍යය කීය)

1 අනන්ත ගුණං, කෙළවරක් නැති ගුණ ඇත්තාවූ; සද්දවුත්තිප්පකාසකං, ශබ්දයන්ගේ පැවැත්ම ප්‍රකාශකරන්නාවූ; සම්බුද්ධං, සර්වඥයන්වහන්සේද; සද්ධම්මං, සද්ධර්මයද; අරියසංඝංච, ආර්යසංඝයාද; සක්කච්චං, සකස්කොට; අභිවාදිය, වනාකොට වැඳ—

(එහි රත්නත්‍රය ප්‍රණාම ප්‍රයොජනය අන්‍යස්ථානයන්හි බොහෝ ප්‍රකාරයෙන් විස්තාර කෙරෙත්—විශෙෂයෙන් උපද්‍රව ඝාතනාය කැමැති වෙත්—උක්තමැනු—

නිපච්චකාරස්ස තස්ස, කතස්ස රතනත්තයෙ
ආනුභාවෙන සොසෙත්වා, අන්තරායෙ අසෙසතො—යී

රත්නත්‍රය ප්‍රණාමය නම් පරමාර්ථවශයෙන් කාමාවචර කුශලචෙතනායි—ඕ හොමෝද වනාහි ප්‍රථම ජවනචිත්තසම්ප්‍රයුක්තවූවාම මෙහි කැමැත්තනලදී—ඕතොමෝ වනාහි වැන්දයුත්තන්ට වඳින්නවුන්ගේ ශ්‍රද්ධා සම්පත්තියටද අධ්‍යාශය සම්පත්තියටද දෘෂ්ටධර්මවෙදනීය පෞරාණික කුශලකර්මයට බලානුප්‍රදාන වශයෙන් පූර්වකර්මයෙහි ප්‍රසිද්ධවූ විපාකසන්තානයට අන්තරායකරවූ උපපීඩක උපච්ඡෙදක සඞ්ඛ්‍යාත අකුශලකර්මයන් නසා එයට මූලකාරණවූ රොගාදි උපද්‍රව සඞ්ඛ්‍යාත අන්තරායයන්ගේ අනුත්පත්තිය කෙරේ—එසේහෙයින් රත්නත්‍රය ප්‍රණාමවචනය තමාවිසින් ප්‍රාරබ්ධ ප්‍රකරණයාගේ අනන්තරාය සිද්ධිපිණිසද ශිෂ්‍යානුශිෂ්‍යයන්ගේද ප්‍රණාමපූර්වඞ්ගමවූ ප්‍රතිපත්තියෙන් උද්ග්‍රහණ ධාරණාදීන්ගේ සංසිද්ධිය පිණිසද වේ—

“අනන්තගුණං සද්දවුත්තිප්පකාසකං සම්බුද්ධං [illegible]

අරියසංඝඤ්ච සක්කච්චං අභිවාදිය සද්දවුත්තිප්පකාසකං අහං කරිස්සාමි'' යනු සම්බන්ධයි—මේ පදාර්ථසමුච්චයයි –

''අනන්තගුණං සද්දවුත්තිප්පකාසකං ස්වාමිං බුද්ධං සක්කච්චං අභිවාදිය සද්ධම්මඤ්ච සක්කච්චං අභිවාදිය අරියසංඝඤ්ච සක්කච්චං අභිවාදිය සද්දවුත්තිප්පකාසකං අහං කරිස්සාමි'' යනු සම්බන්ධයයි—මේ වාක්‍යාර්ථසමුච්චයයි-මේ දෙකම පාඨානුසාරි සම්බන්ධයයි කියනු ලැබේ—

''අනන්තගුණ චක්කරතන සම්පන්නො චක්කවත්ති රාජා විය අනන්තගුණ චක්කරතන සම්පන්නං සම්මාසම්බුද්ධං, ජනෙහි වහිතබ්බං භාරං වහන්තො විය අපායෙසු අපතමානෙ ජනෙ ධාරෙන්තං ධම්මං, අනවසෙසං අත්තනො වෙරිං හනන්තො රාජා විය කිලෙසාරයො හනන්තං සංඝඤ්ච සක්කච්චං අභිවාදිය'' යනු උපමාසම්බන්ධයයි—

''අනන්තගුණ සමන්නාගතත්තා අනන්තගුණං සම්බුද්ධං, අපායෙසු අපතමානෙ කත්වා ධාරණත්තා ධම්මං අනවසෙස කිලෙසෙ හනනත්තා සංඝඤ්ච සක්කච්චං අභිවාදිය'' යනු හෙතුසම්බන්ධයයි—

''අනන්තගුණ චක්කරතන සම්පන්නො චක්කවත්ති රාජා විය අනන්තගුණ චක්කරතනසම්පන්නත්තා අනන්තගුණ සම්පන්නං සම්බුද්ධං, ජනෙහි වහිතබ්බභාරං වහන්තො විය අපායෙසු අපතමානෙ සත්තෙ ධාරණත්තා ධම්මං, අනවසෙස වෙරිං හනන්තො රාජා විය අනවසෙසෙ කිලෙසෙ හනනත්තා සංඝඤ්ච සක්කච්චං අභිවාදිය'' යනු උපමා හෙතුසම්බන්ධයයි—මේ කියනලද්දේමය—

පාඨානුසාරී සම්බන්ධො, සම්බන්ධො උපමාය ච
හෙතුනාපි ච සම්බන්ධො, උපමාහෙතුනාපි ච
සම්බන්ධභෙද, විඤ්ඤෙය්‍යා, චතුරොති විභාවිනා—යි

එහි 'සම්බුද්ධං සද්ධම්මං අරියසංඝං' යන පදත්‍රය 'අභිවාදිය' යන ක්‍රියාපදයට කර්මයි—'නනුව එකා සත්ති එකා ක්‍රියා නානා සත්ති නානා ක්‍රියා' යි කියෙහයින් එක් ක්‍රියාවකට කර්මභාවය කෙසේ වේදැයත්? දීපකනය හෙයිනි—දීපකනය ද මේ ආදිමධ්‍යඅන්ත වශයෙන් තුන්වැදෑරුම් වේ—

—— ——

මේ වනාහි අනාදිපතනයයි— කර්මයවනාහි උක්තකර්ම අනුක්තකර්මවශයෙන් ද්විප්‍රකාරයි—ඔවුන්අතුරෙන් උක්තකර්ම නම් 'අජිතා දායකා නරෙන' යන ආදියයි—අනුක්තකර්ම නම් 'බුද්ධං වන්දති' යන ආදියයි—ඔවුන්අතුරෙන් අනුක්තකර්මය කුමක් හෙයින් වේදයත්? විභක්ත්‍යාපෙනකතියගේ පැනෙනහෙයිනි—උක්තමැනූ—

වුත්තෙන කම්මාදිසාමින්ස්මිං, ලිඞ්ගත්ථෙ පඨමා සියා
අවුත්තෙතු තවිනෙනෙසු, දුතියා දී යථාරහං—යි

හෙද නිර්වෘත්තිකර්ම විකෘතිකර්ම ප්‍රාප්තිකර්ම වශයෙන් ත්‍රිප්‍රකාරයි—නිර්වෘත්තිකර්මනම් 'කුටිං කරොති' යන ආදියයි—විකෘතිකර්මනම් 'කට්ඨං ඣාපෙති' යන ආදියයි—ප්‍රාප්තිකර්මනම් 'රූපං පස්සති' යන ආදියයි—උක්තමැනූ—

නිබ්බත්තනි විකතිප්පත්තනි, භෙදා කම්මං තිධා මතං
කුටිං කරොති ඣාපෙති, කට්ඨං රූපං විපස්සති—යි

මේ ඔවුන්අතුරෙන් ප්‍රාප්තිකර්මනම්—හෙද කායසම්පත්තිනාම චිත්තසම්පත්තිකර්ම වශයෙන් ද්විප්‍රකාරයි—කායසම්පත්තිකර්මනම් 'බුද්ධං වන්දති' යන ආදියයි--චිත්තසම්පත්තිකර්මනම් 'ආදිච්චං නමස්සති' යන ආදියයි—කියනලදමැයි—

පත්තිකම්මං විධා වුත්තං, කායචිත්තවසා යථා
බුද්ධං වන්දති පූජෙති, ආදිච්චඤ්ච නමස්සති—යි

මේ ඔවුන්අතුරෙන් කායසම්පත්ති කර්මයි—හෙද ඊප්සිතකර්ම අනීප්සිතකර්ම ඊප්සිතානීප්සිතකර්ම වශයෙන් ත්‍රිවිධයි-ඊප්සිතකර්මනම් 'භත්තං භුඤ්ජති' යන ආදියයි--අනීප්සිතකර්මනම් 'විසං ගිලති' යන ආදියයි—ඊප්සිතානීප්සිතකර්මනම් 'ගාමං ගච්ඡන්තො රුක්ඛමූලං පාවිසි' යන ආදියයි—මේ ඔවුන් අතුරෙන් ඊප්සිතකර්මයි-'අනන්තගුණං සද්ධම්මප්පකාසකං' යන පදවය 'සම්බුද්ධං' යන පදයට කර්මවිශෙෂණයි—මේ විශෙෂණයෝ '**විසෙසනෙව**' යන සූත්‍රයෙන් වියපුත්තාශ්‍රය නොවේදයත්? නොවියපුත්තාශ්‍රය—**මොද්ගල්‍යායන** මතයෙහි බාහුල්‍යාධිකාරයෙන්හා **කච්චායන** මතයෙහි විභාසාධිකාරයෙන්—විශෙෂණයනම් භින්න තුල්‍යවශයෙන් ද්විවිධයි—භින්නවිශෙෂණයනම් 'සමෙන ධාවති' යන ආදියයි—තුල්‍යවිශෙෂණයනම් 'අම්බො පාකො' යන ආදියයි—කියනලදමැයි—

විසෙසනං ද්විධා වුත්තං, භින්නාතුල්‍යප්පභෙදතො
ඤෙය්‍යො තස්ස ද්විධා හොති, තුල්‍යො ඡධා තු පරිතො—

සමෙත ධාවති පොසො, විසමෙතාපි ධාවති
ගොත්තෙන ගොතමො නාථො, එකූනතිංසාවයසො—

රාජිනො පුරිසො හොති, න සෙට්ඨි බ්‍රාහ්මණාදිනං
ගෙහෙව තිට්ඨිතො හොති, නසාලාදිසු සොජනො—

අසයාසයීනාචෙව, තබ්භාවො තබ්බිසෙසතා
ධම්මාධාරඵලානම්පි, එකතාති ඡධා මතං—

රත්තො පටො සුචො සෙතො, අසයාසයිතං මතො
බුද්ධො ජිනො කරී හත්ථී, තබ්භාවොති පවුච්චති—

නීලො වණ්ණො අම්බො පාකො, ඉච්චාදෙ තබ්බිසෙසතා
අනිලවෙසො නරො සීහො, ඉති ධම්මකතා මතා—

අම්බිලො ගරුකො හොති, කටුකො ලහුකො රසො
ඉච්චාධාරෙකතා නාම, එකාධාරං හි තං මයං—

ගද,හටං සුසංඛතතං, ඔසධං දුප්පූතතං විසං
ඵලෙකතං ඉදං වුත්තං, ආරොගාදි පපාදිකො—යි

භින්නතුල්‍යවිශෙෂණයත්අතුරෙන් මේ තුල්‍යවිශෙෂණ නම්— ඒ සයවැදෑරුම්වූ තුල්‍යවිශෙෂණයත්අතුරෙන් මේ අසයාසයිභාවතුල්‍යවිශෙෂණයයි දතයුතු—

"අමති ගච්ඡති සභාවා ඔසානන්ති අනෙනා" අමතියි සේයි, සභාවා, සවභාවයෙන්; ඔසානං, අවසානයට; ගච්ඡති ඉති, යේනුයි; අනෙනා, අනන්තනම්—(හේ මඟබාදෑයි) "නත්ථි අන්තො එතස්සාති අනන්තො" අනන්තො, අන්තයතෙම; එතස්ස, මොහට; නත්ථි ඉති, නැත්තේනුයි; අනන්තො, අනන්ත නාම්— මේ බහුබ්‍රීහිසමාසයි— බහුබ්‍රීහිසමාසයනම් තද්ගුණ සංවිඥන බහුබ්‍රීහිසමාස අතද්ගුණ සංවිඥනබහුබ්‍රීහිසමාසවශයෙන් ද්විප්‍රකාරයි— තද්ගුණසංවිඥන බහුබ්‍රීහිසමාසනම් 'ලම්බකණ්ණා' යන ආදියයි— අතද්ගුණ සංවිඥන බහුබ්‍රීහිසමාස නම් 'චිත්තගු' යන ආදියයි—කියනලදමැයි—

තග්ගුණා තග්ගුණා චෙති, පුන චෙති පකාසිතා
යත්ථ විසෙසනො අත්ථො, අඤ්ඤපදෙන ගය්හති
තග්ගුණොති හි සො ඤෙය්‍යො, ලම්බකණ්ණාදිකො මතො—

——සමාසං——

යත්ථ පන න ගය්හන්ති, අතග්ගුණෙහි සො මතො
උදාහරණ මෙතස්ස, දීඝජඞ්ඝාදිකං මතං — යි

මේ ඔවුන් අතුරෙන් තද්ගුණ සංවිඥානබහුබ්‍රීහිසමාසයී-- නැවත අන්තර්වාර්ථබාහ්‍යාර්ථ වශයෙන් විප්‍රකාර වේ--අන්තර්වාර්ථ බහුබ්‍රීහිසමාසනම් 'ජිනාගමෙසො' යන ආදියයි—බාහ්‍යාර්ථබහුබ්‍රීහිසමාසනම් 'මාසජාතො' යන ආදියයි—මේ ඔවුන් අතුරෙන් අන්තර්වාර්ථසමාසනම් වේ—නැවතද ආදිඅන්‍යපද මධ්‍යඅන්‍යපද අන්තඅන්‍යපද වශයෙන් තුන්වැදෑරුම් වේ—ආදිඅන්‍යපද බහුබ්‍රීහිසමාසනම් 'හත්ථපතෙතා' යන ආදියයි—මධ්‍යඅන්‍යපද බහුබ්‍රීහිසමාසනම් 'නාසස අතො අනතො' යන ආදියයි—අන්තඅන්‍යපදබහුබ්‍රීහිසමාසනම් 'දීඝසාගරො' යන ආදියයි— කියනලදමැයි—

ආදිඅඤ්ඤපදඤ්චෙව, මජ්ඣඅඤ්ඤපදං තථා
අන්ත අඤ්ඤපදඤ්චෙව, බහුබ්බීහි තිධා මතො — යි

මේ ඔවුන් අතුරෙන් මධ්‍යඅන්‍යපදබහුබ්‍රීහිසමාසනම් වේ— නැවත විතියාදිවිභක්තීන්ගේ වශයෙන් සයවැදෑරුම් වේ-- විතියා බහුබ්‍රීහිසමාසනම් "ආගතසමණො -- සංඝාරාමො" යන ආදියයි—තෘතීයාබහුබ්‍රීහිසමාසනම් 'ජිතින්ද්‍රියො—සමණො' යන ආදියයි—චතුර්ථිබහුබ්‍රීහි සමාසනම් 'දින්නසුඞ්කො—රාජා' යන ආදියයි—පඤ්චමීබහුබ්‍රීහිසමාසනම් 'නිග්ගතජනො—ගාමො' යන ආදියයි—ෂෂ්ඨීබහුබ්‍රීහිසමාසනම් "ජිනාගමෙසො— පුරිසො" යන ආදියයි—සප්තමීබහුබ්‍රීහිසමාසනම් 'සම්පන්න සස්සා--ජනපදෙ' යන ආදියයි— කියනලදමැයි—

දුතියා තතියා චෙව, චතුත්ථී පඤ්චමී තථා
ඡට්ඨී ච සත්තමී චෙති, ඡබ්බිධො යං බහුබ්බීහි — යි.

මේ ඔවුන් අතුරෙන් ෂෂ්ඨීබහුබ්‍රීහිසමාසයී—'අනන්තගුණං' යන මෙහි අශබ්දය නම් දශාර්ථයන්හි වැටේ-කෙසේද? 'අකත්වා' යන ආදියෙහි ප්‍රතිෂෙධයෙහි වැටේ—'අසෙක්ඛා ධම්මා' යන ආදියෙහි වෘද්ධියෙහි වැටේ—'අනවජ්ජ මරිඤං' යන ආදියෙහි තද්භාවයෙහි වැටේ—'අව්‍යාකතා ධම්මා' යන ආදියෙහි අන්‍යාර්ථයෙහි වැටේ—'අමනුස්සො' යන ආදියෙහි සදෘශාර්ථයෙහි වැටේ—'අකුසලා ධම්මා' යන ආදියෙහි විරුද්ධාර්ථයෙහි වැටේ—'අරාජා' යන ආදියෙහි ගර්හාර්ථයෙහි වැටේ—'අභා

——◦◦——

බේව' යන ආදියෙහි ගුනායෙහි වැටේ—'අජ්ජතනානං සාප යොයං' යන ආදියෙහි වියොගයෙහි වැටේ—'අනුද්දරාකක්ඛෝ' යන ආදියෙහි අල්පාර්ථයෙහි වැටේ—කියනලදමැයි—

පටිසෙධවුඩ්ඪතබ්භාවෙ, අඤ්ඤත්ථෙ සදිසෙ පිච
විරුද්ධෙ ගරහෙ සුඤ්ඤෙ, අකාරො විරහප්පකෙ—යි

ඒ අර්ථයන්අතුරෙන් මෙහි ප්‍රතිෂෙධාර්ථයෙහි වැටේ--ප්‍රතිෂෙධයද ප්‍රසජ්‍යප්‍රතිෂෙධ පර්‍ය්‍යුදාස ප්‍රතිෂෙධ වශයෙන් ද්විප්‍රකාර වේ—ප්‍රසජ්‍යප්‍රතිෂෙධනම් සදෘශාර්ථය නොබලයි--'අසැඩ්ඩා ලවණ්ණභොජ්' යන ආදියයි—පර්‍ය්‍යුදාස ප්‍රතිෂෙධයනම් සමාන කාර්‍ය්‍යලද අර්ථය ගෙණ ප්‍රතිෂෙධකිරීමයි---'අඩ්ඩුරියපසසානි මූඛානි' යන ආදියයි—කියනලදමැයි—

පටිසෙධො ද්විධා වුත්තො, පසජ්ජපරියුදාසතො
නිසෙධෙතබ්බං වත්වාන, සදිසත්ථං න පෙක්ඛති
පසජ්ජපටිසෙධොති, වෙදිතබ්බො සුධීමතා—

පරිතුලිතමත්ථම්පි, උපාදාගෙතබ්බා නිසෙධනං
පරියුදාසො ස විඤ්ඤෙය්‍යො, පණ්ඩිතෙන නිසෙධනො
අඩ්ඩුරියපසසානි මූඛානි, ඉදං පච්ඡිමරූපකං—යි

මේ දෙවුන් අතුරෙන් ප්‍රසජ්‍යප්‍රතිෂෙධනම් වේ—අනාගශබ්දය තෙම්:--

අනෙනානිච්ච සම්පෙඩා, වසාගෙ පදපූරණෙ
දෙහාවයව කොඨාය, නාසසිමාහුලාමකෙ—යි

කියනලද අර්ථයන්අතුරෙන් මෙහි අවසාන අර්ථ්‍යත්හේ වේ—''ගුණ්‍යනෙන පකාසයනෙන අතනනො ආධාරං පුගගලනතිගුණො'' ගුණ්‍යනෙනායි සේයී; අතතනො, තමාගට; ආධාරං, ආධාරවූ; පුගගලං, පුද්ගලයා; පකාසයනෙන ඉති, ප්‍රකාශකෙරෙත්නුයි; ගුණො, ගුණනම් වෙත්—''ගුණ්‍යනෙන පරම් යනෙන පණ්ඩිතෙහිවා-ගුණිනති අනුබන්ධානිතිවා ගුණො'' ගුණ්‍යනෙනායි සේයී; පණ්ඩිතෙහි, පණ්ඩිතයන්විසින්; පරම් යනෙන (ඉත්)වා; ප්‍ර මා ණ ක ර ණු ලැ බෙ ත් නු යි හෝ;—ගුණිනතියි සේයී; අනුබන්ධනති ඉතිවා; ලුහුබඳින්නුයි හෝ; ගුණො, ගුණනම් වෙත්--(ඔව්හු ශීලාදිධර්මයෝයි)—ගුණශබ්දය තෙම්

ගුණෙන පටලරාසිස්ස, ආනිසංසෙව බන්ධනෙ
අප්පධානෙව සීලාදෙ, සුකතාදිම්හි ජීයසෙ —යී

කියනලද මේ අර්ථයන්අතුරෙන් මෙහි බන්ධනයෙහිද ශීලාදියෙහිද වැටේ—"අනන්තො ගුණො යස්ස සොති අනන්තගුණො"නං අනන්තගුණං-අනන්තො, කෙළවරක්නැත්තාවූ; ගුණො, ගුණයතෙමේ; යස්ස, යමෙක්හුගේද; සො ඉති, හේතෙමේනුයි; අනන්තගුණො, අනන්තගුණනම්—(හේ නාගස්විත්තෙමේයි) "අනන්තගුණ සම්බුද්ධං" යන මෙහි ගාථාබන්ධන වශයෙන් අනුනාසිකලොපය වේ—

ඤාණෙ වීතසනෙචෙව, ජාගරෙ ගමනෙපිච
විප්පසෙවනෙසු අත්ථෙසු, බුධසද්දො පවත්තති—යී

කියනලද හෙයින් "චත්තාරි සච්චානි සබ්බධම්මෙ වා සම්මා සාමංවා බුජ්ඣතීවා අඤ්ඤෙ බොධෙතීතිවා, අග්ගමග්ගඤාණසමාගමෙන අපරිමිතගුණගණාලඞ්කතසබ්බඤ්ඤුතඤාණප්පත්තියා සම්මා සාමංවා බුජ්ඣතිවා අඤ්ඤෙ බොධාපෙතීතිවා-සයමෙව අවිජ්ජාරත්තියං කිලෙසනිද්දූනතො අනඤ්ඤබොධිතො හුත්වා පටිබුජ්ඣතිවා අඤ්ඤෙ සම්මා පටිබොධාපෙතීතිවා—නිබ්බාණමහානගරං සම්මා සාමං සම්පන්නමග්ගෙන ගච්ඡතිවා අඤ්ඤෙ ගමාපෙතීතිවා සම්බුද්ධො"—නං සම්බුද්ධං---චත්තාරි සච්චානි, සිව්සසුන්හෝ; සබ්බධම්මෙවා, සර්වධර්මයන් හෝ; සම්මා,මනාකොට හෝ; සාමංවා,තෙමේ හෝ; බුජ්ඣතිවා, දනීනුයි හෝ; අඤ්ඤෙ, අනුන්ට; බොධෙති ඉතිවා, දන්වානුයි හෝ; අග්ග මග්ග ඤාණසමාගමෙන; අග්‍රමාර්ගඥානසමාගමයෙන්; අපරිමිත, ප්‍රමාණරහිතවූ; ගුණගණාලඞ්කත, ගුණසමූහයෙන් අලඞ්කෘතවූ; සබ්බඤ්ඤුතඤාණප්පත්තියා, සර්වඥතාඥානප්‍රාප්තියෙන්; සම්මා, මනාකොට හෝ; සාමංවා, තෙමේ හෝ; බුජ්ඣතිවා, ප්‍රබොධවේනුයිහෝ; අඤ්ඤෙ, සෙස්සන්; බොධාපෙති ඉතිවා, ප්‍රබොධ කෙරේනුයිහෝ; සයං එව, තෙමේම; අවිජ්ජාරත්තියං; අවිද්‍යානැමැති රාත්‍රියෙහි; කිලෙසනිද්දූනතො, ක්ලෙශ නැමැති නිද්‍රාවෙන්; අනඤ්ඤබොධිතො හුත්වා, අනිකෙකුවිසින් නුප්‍රබුද්ධවනලද්දුව; පටිබුජ්ඣතිවා, ප්‍රබුද්ධිනුයි හෝ; අඤ්ඤෙ,සෙස්සන්; සම්මා,මනාකොට; පටිබොධාපෙතිවා,ප්‍රබුද්ධවානුයිහෝ;—නිබ්බාණ මහානගරං; නිර්වාණනැමැති මහනුවරට; සම්මා, මනාකොට හෝ; සාමංවා, තෙමේ හෝ;

සතිපට්ඨානම්ගෙගන. ධිවටන්මගින්; ගච්ඡතිවා, යේනුදීහෝ; අක්ඛි, ඇස්සන්; ගමාපෙති ඉතිවා, යවානුදීහෝ; සම්බුද්ධො, සම්බුද්ධනම්—යථොක්ත වචනාර්ථයොගයෙන් සම්බුද්ධශබ්දයාගේ නිරුක්තයන්නෙතරෙනිදු වැටෙනහෙයින් “අනන්තගුණං සද්දවුත්තිප්පකාසකං” යන මේ පදවයෙන් වෙසෙසයි—“බොධිරුක්ඛමූලෙ නාථො සම්මාසම්බුද්ධො” යන ආදියෙහි නිපාතයෝ සම්‍යක්සම්බුද්ධයයි කියනුලැබෙන්—ඔව්හුද සම්‍යක්සම්බුද්ධයයි තමන් ප්‍රතිඥ කෙරෙති—සංශබ්දය තෙමේ—

සම්මා සාමෙසු සංසද්දෙ, සමොධානෙව සංගතෙ
සමන්තභාවෙ සඞ්ඛෙපෙ, භුසත්ථෙ අප්පකෙපිච—

සභාවෙ පභවෙ තෙච, සඞ්ඝභාගිබුද්ධෙසුච
සංසරණෙ පිධානෙච, සම්බාධාදිසු දිස්සති—යි

කියනලද මේ අර්ථයන්අතුරෙන් සම්මා ශබ්දයාගේ අර්ථයෙහි වැටේ—“සද්දීයතෙ උච්චාරියතෙති සද්දො” සද්දීයතෙ පීසේයි; උච්චාරියතෙ ඉති, කියනුලැබේනුයි; සද්දො, සද්දනම්—“වත්තනං වුත්ති” වත්තනං, පැවැත්ම; වුත්ති, වුත්තිනම්—“සද්දස්ස වුත්ති සද්දවුත්ති” සද්දස්ස, ශබ්දයාගේ; වුත්ති, පැවැත්ම; සද්දවුත්ති, සද්දවුත්තිනම්—මේ තත්පුරුෂ සමාසයි—තත්පුරුෂසමාසයනම් විභක්ති තත්පුරුෂාදිවශයෙන් සත්වැදෑරුම් වේ ද්විතියාතත්පුරුෂයනම් “භූමිගතො” යන ආදියයි—තෘතීයාතත්පුරුෂයනම් ‘සල්ලවිද්ධො’ යන ආදියයි—චතුර්ථී තත්පුරුෂයනම් ‘ආගන්තුකභත්තං’ යන ආදියයි—පඤ්චමීතත්පුරුෂයනම් ‘චොරභයං’ යන ආදියයි—ෂෂ්ඨී තත්පුරුෂයනම් ‘ධඤ්ඤරාසි’ යන ආදියයි—සප්තමීතත්පුරුෂයනම් ‘සංසාරදුක්ඛං’ යන ආදියයි—උභයතත්පුරුෂයනාම් ‘අභ්‍යාගමණෙ’ යන ආදියයි—කියනලදමැයි—

උභෙ දුතියා තතියාච, චතුත්ථි පඤ්චමී තථා
ඡට්ඨීච සත්තමීචෙති, සත්ත තප්පුරිසා මතා—යි

මේ ඔවුන්අතුරෙන් ෂෂ්ඨී තත්පුරුෂයි—“සද්දවුත්තිං පකාසෙතීති සද්දවුත්තිප්පකාසකො” තං සද්දවුත්තිප්පකාසකං—සද්දවුත්තිං, ශබ්දවෘත්තිය; පකාසෙති ඉති, ප්‍රකාශ කෙරේනුයි; සද්දවුත්තිප්පකාසකො, සද්දවුත්තිප්පකාසකනම්—

———

(සේ තාගතවින්ගෙනමිසී) “අත්තානං ධාරෙන්තෙ චතුසු අපායෙසු විවිදුගෙතියුව අපතමානෙ කත්වා ධාරෙතීති ධම්මො” අත්තානං, තමා; ධාරෙන්තෙ, දරන්නවුන්; චතුසු අපායෙසු, සතරඅපායයන්හිදඃ වට්ටදුකොතියුව, ව්‍යසනදුඃඛයන්හිදු; අපතමානෙ කත්වා, නොවැටෙන්නවුන් කොට; ධාරෙති ඉති, දරාද්ද; ධම්මො, ධම්මනම්—“පඤ්ඤත්තෙහි ධාරියන්තීති වා ධම්මා” පඤ්ඤත්තෙහි; පඬුවන්විසින්; ධාරියන්ති ඉති වා, දරණුලැබෙන්නුයි හෝ; ධම්මො, ධම්මනම්—ශේවනාහි චතුමාර්ගඵලනිර්වාණ විශයෙන් නවවැදෑරුම්,පර්‍යාප්තිය හා දසවැදෑරුම්හෝ වේ—‘සතං සප්පුරිසානං,සන්තොවා,පරමත්ථතො සං විජ්ජමානො, ස්වාක්ඛාතතාදි ගුණයොගතො වා පසත්ථො ධම්මො සද්ධම්මො’ තං සද්ධම්මං—සතංයි සේයි; සප්පුරිසානං, සත්පුරුෂයන්ගේ හෝ; සන්තොවා, ශාන්තවූහෝ; පරමත්ථතො, පරමාර්ථවශයෙන්; සංයි සේයි; විජ්ජමානො, විද්‍යමානවූහෝ; ස්වාක්ඛාතතාදි ගුණයොගතො; ස්වාක්ඛාතතාදි ගුණයොගයෙන්; පසත්ථොවා, ප්‍රශස්තවූහෝ; ධම්මො, ධර්මයතෙම; සද්ධම්මො, සද්ධම්මනම්—ධම්මශබ්දයතෙව—

ධම්මො සභාවෙ පරියත්තිපඤ්ඤා
ඤායෙසු, සච්චප්පකතීසු පුඤ්ඤෙ
ඤෙය්‍යෙ ගුණාචාරසමාධිසූපි
නිස්සත්තතාපත්තිසු කාරණාදො—යි

කියනලද මේ අර්ථයන්අතුරෙන් පර්‍යාප්තියෙහි වැටේයයි දතයුතු—“ආරකාතා කිලෙසෙහි; අයෙන ඉරියනතො, අයෙ ඉරියනතො, සදෙවකෙන ලොකෙන අරණීයතො බුද්ධාච පච්චෙකබුද්ධාච සාවකාච අරියාති වුච්චන්ති—කිලෙසෙහි, කෙලෙසයන්ගෙන්; ආරකාතා, දුරුහෙයින්ද; අයෙන, අයයෙන්; ඉරියනතො, පැවතිහෙයින්ද; අයෙ, අයයෙහි; ඉරියනතො, පැවතිහෙයින්ද; සදෙවකෙන, දෙවියන්සහිතවූ; ලොකෙන, ලොකයාවිසින්; අරණීයතො, එළඹියයුතුහෙයින්ද; බුද්ධාච, බුදුවරයෝද; පච්චෙකබුද්ධාච, පසේබුදුවරයෝද; සාවකාච, සව්වෝද; අරියා ඉති, ආර්‍යයෝයයි, වුච්චන්ති, කියනුලැබෙත්—මෙහි බුද්ධශ්‍රාවකයෝම ගන්නා ලද්දහුය—“කිලෙසාරයො හනති හිංසතීති සංඝො”කිලෙසාරයො; කෙලෙස් සතුරන්; හනතීයි සේයි; හිංසති ඉති, නසා

නුයී; සංඝො, සංඝනම්—‘අරියොච සො සංඝොචාති අරියසංඝො’ නං අරියසංඝං--අරියොච සො, අසඞ්ඛුද්දෙද ගේෂනෙමිය; සංඝොච ඉති, සංඝවුද්දෙද ශේෂනමේනුයි; අරියසංඝො, අරියසංඝනම්—මේ කම්මධාරය සමාසයි—කම්මධාරය සමාසනම් විශෙෂණ පූර්වපදාදිවශයෙන් සයවැදෑරුම් වේ—විශෙෂණ පූර්වපදය නම් “නීලුප්පලං” යන ආදියයි—විශෙෂණොත්තරපදයනම් “චක්ඛුභූතො” යන ආදියයි- විශෙෂණොභයපදනම් “සඩිපණ්ඩරං” යන ආදියයි—උපමානොත්තරපදනම් “නරසීහො” යන ආදියයි—සම්භාවනාපූර්වපද නම් “ගුණබුද්ධි” යන ආදියයි—අවධාරණපූර්වපදනම් “ගුණධනං” යන ආදියයි—කියනලදම්‍යයි—

විසෙසන පුබ්බපදෙ, විසෙසනුත්තරෙපිච
විසෙසනො භයපදෙ, උපමානුත්තරෙපිච
සම්භාවනා වධාරෙච, ඡබ්බිධො කම්මධාරයො—යි

ඔවුන් අතුරෙන් මේ විශෙෂණපූර්වපද කම්මධාරයනම්—ශබ්දාර්ථයනෙම වාක්‍යපන්‍යාස සමුච්චය වශයෙන් ද්විප්‍රකාර වේ—ඒ පූර්වයෙහි කිසිවක් කියා පසුව විස්තරකිරීමයි—කියන ලදම්‍යයි—

එසඤ්ඤෙව වාක්‍යරම්භො, උපන්‍යාසොති වුච්චතෙ
ත්‍යක්ඛ්වා වත්ථුං පරං වත්තු, කාමානඤ්ච පයොගතො—යි

සමුච්චයනෙමේද වයානුගත අඞ්ගානුගතවශයෙන් ද්විප්‍රකාර වේ—වයානුගත සමුච්චය නම් ‘සඤ්ඤාච සාරිපුත්තොච ධම්මං දෙශෙසි’ යන ආදියයි—අඞ්ගානුගතසමුච්චයනාම් “දේවරාචෙන්දහරොච පිණ්ඩාය චරතසි” යන ආදියයි—තේද ද්‍රව්‍යසමුච්චය ගුණසමුච්චය ක්‍රියාසමුච්චය වශයෙන් තුන්වැදෑරුම් වේ—ද්‍රව්‍යසමුච්චය නම් “සමණස්ස බ්‍රාහ්මණස්සච ගාමො” යන ආදියයි—ගුණසමුච්චයනාම් “යත්තාදිඤ්ච විජානඤ්ච සීලං” යන ආදියයි—ක්‍රියා සමුච්චය නාම් “යතිච විජෙච ගච්ඡති” යන ආදියයි—කියනලදම්‍යයි—

සමුච්චයෙ කතෙ විනාං, බහූනම්පි පනීයතෙ
ව්‍යඞ්ගානුගතා සඞ්ඛ්‍යා, වාක්‍යෙ වත්‍යනුසාරතො—

සඤ්ඤාච සාරිපුත්තොච, ධම්මං දෙසෙසි ...
... දකුණෙහිද, පිණ්ඩාය චරතසි—

ගහපතිකොච විජෙච, සඤ්ඤසඤ්ඤී වාපන
ඵලො අම්බො අඵලොච, තෙ සත්තාරෙ උභො මම—

අහඤ්ච අරියා මනුස්සලොකෙ, උභො මයං දානපතී අහුම්හ

වඤ්ඤුවාක්‍යෙ වසද්දෙන, නීතො ධම්මී පතීයතෙ
දබ්බං ගුණං ක්‍රියාවාපි, වඤ්ඤුවාක්‍යානුසාරිනා—

යථාවුත්තීනං ගාථො අත්ථි, යතිනඤ්ච විජානඤ්ච
ඵලං ගච්ඡති යති විජෙ—යී

ඒ අර්ථයන් දෙදෙනා අතුරෙන් මේ සමුච්චයාර්ථයි—'සක්කච්චං' යන පදය 'අභිවාදිය' යන පදයට ක්‍රියාවිශෙෂණයි—ක්‍රියා විශෙෂණනම් බාහ්‍ය අබාහ්‍ය වශයෙන් ද්විප්‍රකාර වේ—බාහ්‍යක්‍රියා විශෙෂණයනම් "වජාගි දෙවදත්ත" යන ආදිය යි—අබාහ්‍ය ක්‍රියාවිශෙෂණයනම් "මුදුං පචති" යන ආදියයි—කියනලදමැයි—

ක්‍රියා විසෙසනං නාම, ද්විවිධං සමුදීරිතං
බජ්ඣාලපනං සබ්බං, අබජ්ඣා මුදාදිකං—යී

අබාහ්‍ය ක්‍රියාවිශෙෂණයද ප්‍රථමා විතියාදිවශයෙන් ද්විවිධ වේ—ප්‍රථමාක්‍රියාවිශෙෂණයනම් අකර්මකධාතූන් කෙරෙන් වේ—ද්විතීයා ක්‍රියාවිශෙෂණයනම් සකර්මකධාතූන් කෙරෙන් වේ—කියනලදමැයි—

අබජ්ඣා දුධා හොති, පඨමා දුතියා වසා
සකම්මකාය දුතියා, අකම්මා පඨමා මතා—යී

"අභිවන්දනං අභිවාදිය" අභිවන්දනං, වැඳීම; අභිවාදිය, අභිවාදිය යනු වේ—"අභිවන්දිතුනාති අභිවාදිය" අභිවන්දන ඉති, වැඳ යන අර්ථයෙහි; අභිවාදිය. අභිවාදිය යනු වේ—"අභිවන්දියතෙ ඉති, වඳිනුලැබේ නුයී; අභිවාද්‍ය, අභිවාදිය යනු වේ—මෙසේ තුන්සංඥාහයෝ කටයුත්තාහුය—කියනලදමැයි—

තවෙ තුං තුනතුනාත්වා, භාවෙ කත්තරි කම්මනි
චකාරණෙත්ථ භාවෙච, තබ්බාදයො නියමිතා තෙ—යී

ඔවුන් අතුරෙන් මධ්‍යමාර්ථය යොග්‍ය වේ—කුමක් හෙයින් දයත්? "අභිවාදිය" යන පදයෙහි 'අගං' යන කාර්‍ය්‍යාර්ථවාච

—— ආඛ්‍යාතං ——

ත 'කරිස්සාමි' යන පදයහා සමානාධිකරණභාවයෙන්හා ඔහුගේම විශේෂණභාවයෙනි—එසේහෙයින් 'අභිවන්දනා ති අභිවන්දිය'තියා විග්‍රහ කටයුතු—'අභිවාදිය' යන පදයෙහි ත්වාප්‍රත්‍යය පූර්වකාලාදිඅර්ථයන්හි වේ—කියනලදමැයි—

පුබ්බාපර සමානෙච, කාලෙ හෙතුම්හි ත්වාදයො
පච්චත්වා ගුණ්ණන්ති පොසො, ජදහිත්වාන නික්ඛමි
තක්කොච්ච පතිතො දණ්ඩො, පීත්වා හොති සතං බලං—යි

ඔවුන්අනුරෙන් මෙහි පූර්වකාලයෙහි කැමැතිවනලදී—අනික් තැනෙහි නොකැමැතිවනලදී—කුමක්හෙයින්දයත්? අයුක්තහෙයිනි—අභි යනු උපසර්ගයි-උපසර්ගනම් උපසර්ගාර්ථක උපසර්ගානුලොමවශයෙන් ත්‍රිප්‍රකාර වේ--යම්කලෙක්හි උපසර්ගයන්හා යොදනලද ධාතුහු තමන්ගේ අර්ථය හරිද්ද එකල්හි උපසර්ගාර්ථකය නම් වෙත්—'ජිනො ලොකං අභිභවති' යන ආදියයි—යම්කලෙක ඒධාතුහු ඉදින් තමන්ගේ අර්ථය නොහරිත්නම් එකල්හි උපසර්ගානුලොමනම් වෙත—'උග්ගච්ඡති සූරියො' යන ආදියයි—උක්තමැතු—

උපසග්ගත්ථසෙක්ඛච, උපසග්ගානු ලොමතා
උපසග්ගා දුව්ධාති, විඤ්ඤෙය්‍යා සාරමිත්තිනා—

යද උපසග්ග පුන්තා, ධාතවො අත්තනො අත්ථං
ජහන්තීති උපසග්ග, ත්ථකෙසො නාමාති වුච්චති—

යද පන නජහන්ති, තදනුකූලාති වුච්චන්ති
අනුග්ගණ්හනෙත තයා සුබං, උග්ගච්ඡති සූරියො තමා—යි

'සාමඤ්ඤං විසෙසස්සං විසෙසං භෙදකං' යි කිහෙයින් 'කරිස්සාමි' යන පදය විශේෂණ විය යුතු නොවේද? 'අභිවාදිය' යන පදය කාරකත්‍රය වාචකබැවින්හා පූර්වකාලාදිචතුරර්ථයන් වාචකබැවින්ද සාමාන්‍යවූයේ නොවේද? 'කරිස්සාමි' යන පදය වනාහි කර්තෘවාචක බැවින්හා එකාන්තයෙන් පරකාලිකබැවින්ද විශේෂණවූයේ නොවේදැයි? මේ සැබව එතකුදුවූවත් එසේ නොදතයුතු—මෙහි වනාහි 'කරිස්සාමි' යන පදය විශේෂ්‍යයි—'කරිස්සාමි' යි කීකල්හි අනුභව කොම්හෝ සයනය කොටහෝ යම්කිසිපූර්වකාර්යයක් කොට 'කරිස්සා

——◦◦——

2 සද්දවුත්තිං නිමිත්තෙනස්සු, ජෙතකාමෙන භික්ඛුනා
යාචිතොහං කරිස්සාමි, **සද්දවුත්තිප්පකාසකං**—

---

මි' යි නියම නොකරණලද්දේ වෙයි–'අභවාදිය' යි කීකල්හි වනාහි සෙසුපූර්වකාලය වලකයි—කියනදලමැයි—

සබ්බානෙතානි සිජ්ඣමානා, ක්‍රියා කාමං හි යථාවා
තථාවා හුත්‍වා කිඤ්චාපි, අප්පධානාව හොන්ති—යි

(මෙසේ සියලු අකුශලයන්ගේද තන්මූලකාරණවූ රෝගාදි උපද්‍රවයන්ගේද විධ්වංසනයට සමර්ථවූ තුන්ලෝවාසීන්ට පුණ්‍යක්ෂෙත්‍රවූ අහෙතුකයන්ට ද්විහෙතුක සම්පත්තියද ද්විහෙතුකයන්ට ත්‍රිහෙතුක සම්පත්තියද ත්‍රිහෙතුකයන්ට මනුෂ්‍ය දිව්‍ය නිර්වාණ සම්පත්තින්ද දෙන්ට සමර්ථවූ රත්නත්‍රයට ප්‍රණාමය දක්වා දැන් සංඥාදි පූර්වපක්ෂවකය දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ '**සද්දවුත්ති**' යන ආදිය කීය)

2 අහං, මම; සද්දවුත්තිං නිමිත්තෙනස්සු, ශබ්ද ප්‍රවෘත්ති නිමිත්තයන්හි; ජෙතං, දක්ෂවූ; කාමෙන, කැමැත්තාවූ; භික්ඛුනා, භික්ෂුවවිසින්; යාචිතො, යාඥකරණලද්දේ; සද්දවුත්තිප්පකාසකං, ශබ්ද වෘත්තිප්‍රකාශනම් ප්‍රකරණයක්; කරිස්සාමි, කරන්නෙමි—

('සද්දවුත්තිප්පකාසකං' යන පදයෙන් සංඥාවද 'භික්ඛුනා' යන පදයෙන් නිමිත්තද දක්වයි—මෙහි කරුණා නම් අධ්‍යාත්මකයි–ශබ්දප්‍රකරණයන්හි ව්‍යක්තිය කැමැත්තවන්නාවූ යාඥ කරණලද කරුණාවහා ඥානයඇති භික්ෂුව දැක කෙසේ වනාහි මේ සත්වයෝ ශබ්දයෙහි ව්‍යක්තවන්නාහුද ශබ්දග්‍රන්ථයෝද ඉතා බොහෝයයි කරුණාතොමෝ උපදී' ඒ හෙයින් ඔවුන්ගේ සුවසේ ගැන්මපිණිස මේ ශබ්දවෘත්ති ප්‍රකාශනම් ග්‍රන්ථය කෙළේය—'අහං කරිස්සාමි' යන පදවයෙන් කර්තෘනු දක්වයි—''සද්දවුත්තිප්පකාසකං'' යන පදයාගේ සාමර්ථ්‍යයෙන් ප්‍රයොජන ප්‍රමාණයන් දක්වයි–සංඥාවගේ දක්වීමවනාහි ව්‍යවහාරසුඛයපිණිසය—නොදන්නාලද සංඥාඇත්තාහුගේ ව්‍යවහාරසිද්ධිය නොවනහෙයිනි—නිමිත්ත දැක්වීම වනාහි කරුණාවට ආධාරවූ මේ ආචාර්‍ය්‍යතෙමේ නොකාරණයෙන් නොසතුරේ කරුණාවෙන් මෙහෙයනලද සිත් ඇතිව

තෙරේරයයි තමාගේ ගුරුප්‍රතිශ්‍රවණය දක්වයි—තන්තනුගේ දක්වීම්වනානි පරමාර්ථ වශයෙන් මිමැයි නැත්තේය—පඤ්චස්කන්ධයෝම මමැයි කියනුලැබෙති—ඔවුන්අතුරෙන් වනාහි විශේෂයෙන් සතර නාමස්කන්ධයෝද—ඔවුන් අතුරෙහුදු විශේෂයෙන් විඥානස්කන්ධයද ඔවුන්අතුරෙන් කාමාවචර සිතද ඔවුන් අතුරෙන් කුශලයද ඔවුන්අතුරෙන් සෞමනස්සසහගත වූයේද ඔවුන් අතුරෙහුදු ඥානසම්ප්‍රයුක්තවූයේද ඔවුන් අතුරෙහුදු සසංස්කාරික වූයේද මෙහි මමැයි කියනුලැබේ සමහරු වනාහි අසංස්කාරිකයයි කියති—මෙහි ඇයෙහයයි ආදියෙහි යොදුකරණලද පුද්ගලයාගේ දක්වනලද මෙසිනි—චේතනාදීහුද කියනුත්තාහු නොවේදැයි? නොකියනුත්තාහුය—'මනොපුබ්බඞ්ගමා ධම්මා' යනු වදාළහෙයිනි—පරමාර්ථවශයෙන් කුශලචිත්තය මෙබඳුවූ ග්‍රන්ථය කෙළේයයි අනුන්ගේ කුශලචිත්තසම්ප්‍රයොගත්වයයි දක්නයුතු—ප්‍රමාණයාගේ දක්වීම වනාහි ශිෂ්‍යයන්ගේ ඉගෙණීමපිණිසය—අප්‍රමාණවූ ග්‍රන්ථය ඉගෙණගන්වද නොකැමැතිවෙත්—ප්‍රයොජනයාගේ දැක්වීමද ඉගෙනීම පිණිසය—ඒ වනාහි ශබ්දලක්ෂණයාගේ හැඟවීම්පිණිසය—මෙහි යථෙප්සිත අර්ථයාගේ සිඞවීම පිණිසයි—'සද්දවුත්ති නිම්මතෙතස්සං' යන පදය 'ජෙකං' යන පදයට ආධාර වේ—ආධාරයනම් ව්‍යාපිත ඖපශ්ලෙෂික සාමීපික විෂයාධාර වශයෙන් චතුර්විධ වේ—ව්‍යාපිකාධාරයනම් 'තිලෙසු තෙලං-ජලෙසු ඛීරං' යන ආදියයි—ඖපශ්ලෙෂිකාධාරයනම් 'පරියඞ්කෙ රාජා සෙති-උක්ඛලීසු ඔදනං පචති' යන ආදියයි—සාමීපිකාධාරයනම් 'ගඞ්ගායං ඝොසො' යන ආදියයි—විෂයාධාරයනම් 'ආකාසෙ සකුණා පක්ඛන්දන්ති—භූමියං මනුස්සා චරන්ති' යන ආදියයි—කියනලද්මැයි—

ව්‍යාපිකො තිලඛීරාදි, කටෙමා ඔපසිලෙසිකො
සාමීපිකො තු ගඞ්ගාදි, ආකාසො විසයො මතො—යි

ඔවුන් අතුරෙන් මේ විෂයාධාරයයි දතයුතු—ඒ විෂයාධාරය තෙමේද දෙශාන්තරාවච්ඡෙදද අනන්‍යථාභාවච්ඡෙදයෙන් ද්විප්‍රකාර වේ—දෙශාන්තරාවච්ඡෙදයනම් "පාදෙසු පතිතො" යන ආදියයි—අනන්‍යථාභාවනම් "ජලෙසු මච්ඡා" යන ආදියයි—ඔවුන්අතුරෙන් දෙශාන්තරාවච්ඡෙදයයි දතයුතු—

'අහං' යන පදය 'කරිස්සාමි' යන පදයාගේ කර්තෘයි-කර්තෘ නම් ස්වසංකර්තෘය හෙතුකර්තෘය කර්මකර්තෘය උක්තකර්තෘය අනුක්තකර්තෘය-යන මොවුන්ගේ වශයෙන් පඤ්චප්‍රකාර වෙ- ස්වයංකර්තෘනම් "සද්ධො පුඤ්ඤං කරොති" යන ආදියයි-හෙතුකර්තෘනම් "පුරිසො පුරිසං කම්මං කාරෙති" යන ආදියයි- කර්මකර්තෘනම් "සයමෙව කටො භිජ්ජතෙ" යන ආදියයි— උක්තකර්තෘනම් "රථං කරොති නරො" යන ආදියයි-අනුක්තකර්තෘනම් "සූදෙන පච්චතෙ ඔදනො" යන ආදියයි—උක්ත මැනු—

සයංකත්තා හෙතුකම්ම, කත්තා අභිහිතො තථා
කත්තා නාභිහිතො චෙති, කත්තා පඤ්චවිධො භවෙ—යි

ඔවුන්අතුරෙන් උක්තකර්තෘයයි දතයුතු—"සද්දවුත්තියා නිමිත්තං සද්දවුත්ති නිමිත්තං" තෙසු සද්දවුත්තිනිමිත්තෙක හු—සද්දවුත්තියා, ශබ්දප්‍රවෘත්තියට, නිමිත්තං, නිමිත්තවූයේ; සද්දවුත්ති නිමිත්තං, සද්දවුත්තිනිමිත්ත නම්-මේ නිමිත්ත ශබ්දයතෙමේද කාරණ පරිච්ඡෙද අඞ්ගජාතාදියෙහි දක්නාලැබේ—ඔවුන් අතුරෙන් "චතුරො නිමිත්තෙ අද්දසා" යන ආදියෙහි කාරණයෙහි පැනේ-"පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං" යන ආදියෙහි පරිච්ඡෙදයෙහි පැනේ--"ඉත්ථිනිමිත්තං" යන ආදියෙහි අඞ්ගජාතයෙහි පැනේ--ඒ මේ නිමිත්තශබ්දයතෙමේ මෙහි කාරණාර්ථයෙහි වැටේ--"කාමෙතීති කාමො" තෙන කාමෙන--කාමෙති ඉති, කැමැති වේනුයි; කාමො, කාම නම්--කාම ශබ්දයතෙමේ—

කිලෙසෙ වත්ථුකාමෙච, පඤ්චකාමගුණෙසුච
පුග්ගලෙ පුඤ්ඤපජ්ජෙසුච, කාමසද්දො පවත්තති—යි

කීයනලද අර්ථයන් අතුරෙන් මෙහි පුණ්‍යජන්දයෙහි වැටේ--"ජෙකං කාමෙන" යි කිච්චමනාතත්හි ගාථා බන්ධනවශයෙන් අනුනාසිකයගට ලොප් කොට "ජෙකකාමෙන" යි කියනලදී--

"තදඞ්ග වික්ඛම්භන සමුච්ඡෙදවිසෙන කිලෙසෙ ජිනාතීති ජිනො" තදඞ්ග වික්ඛම්භන සමුච්ඡෙදවසෙන, තදඞ්ග වික්ඛම්භන සමුච්ඡෙද වශයෙන්, කිලෙසෙ, කෙලෙශයන්;

ජිඥති ඉති, සිඳිනුයි; භික්ඛු, භික්ඛුනම්--‘‘සංසාරභයං ඉක්ඛ
ති පස්සතීතිවා භික්ඛු" සංසාරභයං සසරබිය; ඉක්ඛතියි යේ
දී; පස්සති ඉතිවා, දකිනුයි හෝ; භික්ඛු, භික්ඛුනම්--‘‘ජිනභි
න්නපටං ධාරෙතීතිවා භික්ඛු" ජිණ්ණභින්නපටං, සුන්බුන්ව
ත්, ධාරෙති ඉතිවා, දරනුයිහෝ; භික්ඛු, භික්ඛුනම්--‘‘භික්ඛ
ති යාචතීතිවා භික්ඛු" භික්ඛතියි සේයි; යාචති ඉතිවා, ඉල්
වානුයි හෝ; භික්ඛු, භික්ඛුනම්--‘‘භික්ඛනසීලොතිවා භි
ක්ඛු" භික්ඛන සීලො ඉතිවා, සිඟනසිලීනුයි හෝ; භික්ඛු, භි
ක්ඛුනම්--‘‘භික්ඛන ධම්මොතිවා භික්ඛු" භික්ඛනධම්මො ඉ
තිවා, සිඟනස්වභාවඇත්තේනුයි හෝ; භික්ඛු, භික්ඛුනම්--
‘‘භික්ඛනෙ සාධුකාරීතිවා භික්ඛු" තෙන භික්ඛුනා--භික්ඛ
නෙ, සිඟීමෙහි; සාධුකාරීඉතිවා, දක්ෂනුයිහෝ; භික්ඛු, භික්ඛු
නම්--ඒ සියලු භික්ෂුහුම මෙහි ලැබෙත්--සියලු ක්ෂීණාශ්‍රවන්
ගේ උගතයුතු බවක් නැතිහෙයිනි--ක්ෂීණාශ්‍රවයෝ වනාහි
ශබ්දශාස්ත්‍රය පූරත්මය--විශෙෂයෙන් වනාහි පෘථග්ජන භි
ක්ෂුහු මෙහි ලැබෙතියි--‘‘යාචිතබ්බොති යාචිතො" යාචිත
බ්බො ඉති, ඉල්වියයුත්තේ නුයි; යාචිතො, යාචිතනම්--යාච
ධාතු තමා ද්විකර්මික ධාතුබැවින් ‘‘සද්දවුත්තිප්පකාසකං
අගං" යි කර්මවය වේ--උක්තමැනු—

දුහ යාච රුධි පුච්ඡ, භික්ඛ සාස වචාදයො
නී වහ හරාදයොච, උභයෙ තෙ ද්විකම්මිකා—යි

‘‘සද්දවුත්තිං පකාසෙති එතං එතෙනාතිවා සද්දවුත්තිප්ප
කාසකං" එතංවා, මෙහිහෝ; එතෙනවා, මේකරණ කොට
ගෙණ හෝ; සද්දවුත්තිං, ශබ්දවෘත්තිය; පකාසෙති ඉති,
ප්‍රකාශ කෙරේනුයි; සද්දවුත්තිප්පකාසකං, සද්දවුත්තිප්පකාස
කනම් ‘අරුණවති නගරං’යන අද්යෙහි මෙන් නිත්‍යලිඞ්ගයි--
‘‘සද්දවුත්ති නිමිත්තං පකාසෙති එතං එතෙනාතිවා සද්දවු
ත්තිප්පකාසකං" තං සද්දවුත්තිප්පකාසකං--එතං, මෙහි; එ
තෙන, මේකරණ කොට ගෙණ; සද්දවුත්ති නිමිත්තං, ශබ්ද
වෘත්ති නිමිත්ත, පකාසෙති ඉතිවා, ප්‍රකාශ කෙරේනුයි හෝ;
සද්දවුත්තිප්පකාසකං, සද්දවුත්තිප්පකාසකනම්--මෙම ‘ස
ද්දවුත්ති නිමිත්තප්පකාසකං’යි කිවමනාතන්හි නිමිත්ත ශබ්ද
ය හට ලොප් කොට ‘සද්දවුත්තිප්පකාසකං’ යි කියනලදී--

3 සද්දො පඤ්චවිධො තාව, ඤායතෙ පිටකත්තයෙ
නාම ජාති දබ්බ ක්‍රියා, ගුණසද්දාන භෙදතො—

'නාමාවචරං' යී කිවමනාතන්හි උත්තරපදලොපය කොට 'නාමං' යී කිවාක්මෙනි)

(මෙසේ සංඥාදි පූර්වපඤ්චකය දක්වා දැන් සද්දවුත්තිප්පකාසකං අහං කරිස්සාමි''යී තමාවිසින් ප්‍රතිඥාකරණලද මේ ප්‍රකරණය ප්‍රාරම්භකරන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ **''සද්දො පඤ්චවිධො''** යන ආදිය කිය)

3 පිටකත්තයෙ, පිටකත්‍රයෙහි; නාම, නාම ශබ්දය; ජාති, ජාතිශබ්දය; දබ්බ, ද්‍රව්‍යශබ්දය; ක්‍රියා, ක්‍රියාශබ්දය; ගුණසද්දානං, ගුණශබ්දය යන මොවුන්ගේ; භෙදතො, භෙදයෙන්; සද්දො, ශබ්දයතෙම; තාව, පළමුකොට; පඤ්චවිධො ඤායතෙ, පඤ්චප්‍රකාර වේ—

(''සද්දති සොතවිඤ්ඤාණ රම්මණභාවං ගච්ඡතීති සද්දො,'' සද්දතියී සේයී; සොතවිඤ්ඤාණාරම්මණභාවං ශ්‍රොත්‍රවිඥානයාගේ අරමුණුබවට; ගච්ඡති ඉති, යේනුයී; සද්දො, සද්දනම් (ගේ ඍනුජශබ්දයී) ''සප්පති උච්චාරියතීති සද්දො''සප්පතියී සේයී; උච්චාරීයති ඉති, කියනුලැබේනුයී, සද්දො, සද්ද නම් (ගේ චිත්තජශබ්දයී) ඔවුන්අනුරෙන් පශ්චිමාර්ධයම නාමාදිවශයෙන් පස්වැදෑරුම් වේ- නැවත සවිඤානක අවිඥානක වශයෙන් විප්‍රකාර වේ--සවිඥානකශබ්දනම් චිත්තජයී--අවිඥානක ශබ්දනම් ඍතුජයී—උක්තමැනු—

සවිඤ්ඤාණකසද්දොච, හොති චිත්තසමුට්ඨිතො
අවිඤ්ඤාණක සද්දො යො,සො හොතුජ සමුට්ඨිතො—යී

ඔවුන් අතුරෙන් සවිඥානක ශබ්දය තෙමේම නාමාදි වශයෙන් පඤ්චප්‍රකාර වේ--නැවතද නිෂ්පන්න ප්‍රාතිපදික අනිෂ්පන්න ප්‍රාතිපදිකශබ්දවශයෙන් විප්‍රකාර වේ--ධාතුවශයෙන් සිද්ධවූයේ නිෂ්පන්නප්‍රාතිපදිකනම්- ධාතුවශයෙන් සිද්ධනුවූයේ අනිෂ්පන්නප්‍රාතිපදිකනම්—උක්තාමැනු—

නිප්ඵන්නා අපි ධාතුහි, සද්දා ගො ඉති ආදයො
අනිප්ඵන්නා ධ ධාතුහි, වාරණාදිප්පභෙදතො—යී

ඔවුන් අතුරෙන් නිප්පන්නශබ්දයම නාමාදිවශයෙන් පස්ප්‍රකාර වේ--නැවතද නිප්පන්න නිප්පන්නප්‍රතිරූපක වශයෙන් ද්විප්‍රකාර වේ--නිප්පන්න ශබ්දයනම් මුඛයෙන් කියනලද 'පුරිස' යන ආදි ශබ්දයි--නිප්පන්නප්‍රතිරූපකශබ්දනම් මුඛයෙන් නොකියනලද දූෂකයන්හි ආරොපිතවූ ශබ්දයි--ඔවුන් අතුරෙන් නිප්පන්නශබ්දයම නාමාදිවශයෙන් පඤ්චවිධ වේ--අවශෙෂය තෙමේම කියන්නේය--"පඤ්ච විධා පකාරා අස්සාති පඤ්චවිධො" විධාසී සේසී;; පඤ්ච පකාරා, පස් ප්‍රකාරවූවෝ, අස්ස ඉති, මෝහට නුයී; පඤ්චවිධො, පඤ්චවිධ නම්--'පඤ්ච' යනු ගණනපරිච්ඡෙදයි-එයින් ඌනාතිරිත්තය ප්‍රතික්ෂෙප කෙරේ--'තාව' යනු ප්‍රථමාර්ථාදි වාචක නිපාතයෙකි--උක්තමැනු--

පඨමත්ථේ තම්ගත්ථෙච, වත්තබ්බනන්තරපෙක්ඛණෙ
අනුක්ඛයන මත්තෙස්සු, තාවසද්දො පවත්තති--යි

මොවුන් අතුරෙන් මෙහි තාවශබ්දයතෙම ප්‍රථමාර්ථයෙහි වැටේ--පිටකශබ්දයාගේ අර්ථය **අභිධානප්‍රදීපිකාසූචියෙහි** විස්තාර වශයෙන් දක්වනලද්දේය කැමැත්තන්විසින් එයින් බලාගතයුතු--"පිටකඤ්ච පිටකඤ්ච පිටකඤ්ච පිටකානි" පිටකංච, පිටකයද; පිටකංච, පිටකයද; පිටකංච, පිටකයද; පිටකානි, පිටකනම් වෙත්--මේ එකශෙෂවශයෙනි---"තිණ්ණං සමූහො තයං" තිණ්ණං, තුන්දෙනෙකුන්ගේ; සමූහො, සමූහයතෙම; තයං, තයනම්--"පිටකානං තයං පිටකත්තයං" තස්මිං පිටකත්තයෙ--පිටකානං, පිටකයන්ගේ; තයං, තුණ, පිටකත්තයං, පිටකත්තයනම්---"නාමඤ්ච ජාතිච දබ්බඤ්ච ක්‍රියාච ගුණඤ්ච නාම ජාති ක්‍රියා ගුණා" නාම--පෙ--ගුණො වා--නාමංච, නාමයද; ජාතිච, ජාතියද; දබ්බංච, ද්‍රව්‍යයද; ක්‍රියාච, ක්‍රියාවද; ගුණංච, ගුණයද; නාම ජාති ක්‍රියා ගුණා, නාමජාති ක්‍රියා ගුණනම් වෙත්---නාම---පෙ---ගුණො'---නාම---පෙ---ගුණො යි හෝ වේ--මේ ද්වන්ද්ව සමාසයයි ද්වන්ද්ව සමාසය නම් සමුච්චයද්වන්ද්වසමාසය සමාහාරද්වන්ද්වසමාසය අන්වාචයද්වන්ද්වසමාසය ඉතරේතරයොගද්වන්ද්වසමාසය යන මොවුන්ගේ වශයෙන් චතුර්විධයි-සමුච්චයද්වන්ද්වසමාසනම් "චීවරපිණ්ඩපාතඤ්ච පච්චය සෙනාසනඤ්ච දදෙය්‍ය" යන ආදියයි--සමාහාරද්වන්ද්වසමාසනම් "චක්ඛුඤ්ච සොතඤ්ච චක්ඛුසොතං" යන

4 දෙවදත්ත සද්දෙ, ගොච, දණ්ඩසද්දෙච පාචකො
පාකසද්දෙ, ඉමෙ පඤ්ච, නාමසඤ්ඤාදිනාමකා—

---

ආදියයි අන්වාචයචඤ්ඤසමාසනම් "දානඤ්ච දෙහි සීලඤ්ච රක්ඛාහි" යනා ආදියයි--ඉතරෙතරයොගචඤ්ඤසමාසනම් "සාරිපුත්තොච මොග්ගල්ලානොච සාරිපුත්ත මොග්ගල්ලානා" යනා ආදියයි—උක්තමැනු—

සමුච්චයො සමාහාරෙ, තථා අන්වාචයොපිච
ඉතරීතරයොගොච, චත්ථො නාම චතුබ්බිධො—යි

ඔහුන් අතුරෙන් ඉතරෙතරචඤ්ඤසමාසයහෝ සමාහාර චඤ්ඤසමාසයහෝ කට්පුතු--ඔවුන්ගේ ලක්ෂණය මෙසේ දතයුතු--සමුච්චයචඤ්ඤනම් එක් ක්‍රියාවකින් සමුච්චය කිරීමයි--අන්වාචයචඤ්ඤනම් "දෙහි--රක්ඛාහි" කියා ක්‍රියා දෙකකින් සමුච්චය කිරීමයි--මේ සමාසයෝ දෙදෙන ක්‍රියාපෙක්ෂක භාවයෙන්ද නාමයන්ගේ අන්‍යෝන්‍ය ප්‍රධානාර්ථභාවයෙන්ද නොවෙත---අන්‍යඃ ශාරිපුත්‍රස්ථවිරයන්ගේ අන්‍ය මෞද්ගල්‍යායන ස්ථවිරයන්හා යෙදුම ඉතරෙතරයොග චඤ්ඤනම් වේ. හේ ඒකාර්ථය අපෙක්ෂා නොකොට බහුවචන කිරීම වේ--සමාහාරචඤ්ඤය ඒකාර්ථය අපෙක්ෂා කොට එකවචන කිරීම වේයයි දතයුතු--"නාම ජාති දබ්බ ක්‍රියා ගුණා එව සද්දා, නාම--පෙ--ගුණ සද්දා" තෙසං නාම ජාති දබ්බ ක්‍රියා ගුණසද්දානං--නාමජාති දබ්බ ක්‍රියා ගුණ එව, නාම ජාති ද්‍රව්‍ය ක්‍රියා ගුණයෝම; සද්දා. ශබ්දවූවානු; නාම ජාති--පෙ--සද්දා, නාම ජාති--පෙ--ශබ්ද නම් වෙත්--"නාමාදිසඤ්ඤවසෙන භෙදනන්ති භෙදො" ත ශනා භෙදතො—නාමාදිසඤ්ඤවසෙන, නාමාදිසංඥාවශයෙන්; භෙදනං ඉති, බිඳීමනුයි; භෙදො, භෙදනම)

(මෙසේ සංඥාදි පරිච්ඡේදවශයෙන්ද නාමාදිසංඥා වශයෙන්ද ශබ්දයන්ගේ ප්‍රවෘත්තිය දක්වා දැන් ඔවුන්ගේ ස්වරූපය දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ **"දෙවදත්තසද්දෙ"** යනා ආදිය කීය)

**4** දෙවදත්තසද්දො, දෙවදත්තශබ්දයද; ගොච, ගොශබ්දයද; දණ්ඩසද්දොච, දණ්ඩශබ්දයද; පාචකො, පාචකශබ්ද

5 එතෙසෙවඟි සද්දෙසු, පඤ්චසු සඞ්ගහං ගතා
සබ්බෙ සද්දා හි භාසන්ති, පඤ්ඤත්තා සද්දගොචරා—

යද; සූතකාසද්දෑව, සූතකාශබ්දයද (යන) ඉමෙපඤ්ච, මේ ශබ්දයෝ පස්දෙන, නාමසද්දෑද්නාමකා, නාමශබ්දාද්නාම ඇත්තාහුවෙත්—

(මෙසේ නාමශබ්දාදී පඤ්චශබ්දයන්ගේ ස්වරූපය දක්වා දුන් දෙව්ලොවෙහි වැඩහිඳ භාග්‍යවතුන්වහන්සේවිසින් දෙශනා කරණලද අභිධම්පිටකයද රජගහනගරාදියෙහි වැඩහිඳ පනවනලද විනයපිටකයද ඒ ඒ ස්ථානයන්හි දෙව් විනිසුන්ට දෙශනාකරණලද සූත්‍රපිටකයද ඉතා බොහෝය-එසේ ඇතිකල්හි ප්‍රඥයන වචනය අයොග්‍යය යන චොදනාව මෙනොහි තබා ඒය පරිහරණය කරන්නේ අනන්තවූනාමිය එක් නාමශබ්දයකින්ද අනන්තවූ ජාතිය එක් ජාතිශබ්දයකින්ද අනන්තවූ ද්‍රව්‍යය එක් ද්‍රව්‍යශබ්දයකින්ද අනන්තවූ ක්‍රියාව එක් ක්‍රියා ශබ්දයකින්ද අනන්තවූ ගුණය එක් ගුණශබ්දයකින්ද සඞ්ග්‍රහ කොට දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ "එතෙසෙවඟි" යන ආදිය කීය)

5 හි, ඒච්චිනාය සැබව, පඤ්චසු එතෙසු එව සද්දෙසු පස් (ප්‍රකාර) මෙම ශබ්දයන්හි, සබ්බෙ සද්දා, සියලුශබ්දයෝ; සඞ්ගහං, සඞ්ග්‍රහවට; ගතා ඉති, ගියාහුයයි; සද්දගොචරා, ශබ්දයන් විෂයකොට ඇත්තාවූ; පඤ්ඤත්තා, ප්‍රඥප්තියෝ; භාසන්ති, කියත්—

("**එතෙසෙවඟි**" යන මෙහි එවශබ්දයතෙමේ ගුණශබ්ද ද්‍රව්‍යශබ්ද ක්‍රියාශබ්දයන්කෙරෙන් පරව වේ--ගුණශබ්දයාකෙරෙන් පරවූ එවශබ්දයට "**ධනුධරෙ එව**" යන ආදිය නිදශීනයී--ද්‍රව්‍යශබ්දයා කෙරෙන් පරවූ එවශබ්දයට "කාළො එව" යන ආදිය නිදශීනයී--ක්‍රියාශබ්දයාකෙරෙන් පරවූ එවශබ්දයට 'අජෙව" යන ආදිය නිදශිනයී—උක්තමැනු—

ගුණද්‍රබ්‍ය ක්‍රියානංචා, ව්‍යවච්ඡෙදවසා තිධා
නිසෙසා ධනුධරො එව, කාලො එව ධනුධරෙ
අජෙව සෙත කාකොති,* ඉදං එතෙසං නිදස්සනා—යී

* අජෙව කාකො සෙතොති—කච්චී.

6 කොලිතො උපතිස්සොච, අනඤ්ඤො බකුලො භගු
කොණ්ඩඤ්ඤො යඤ්ඤදත්තොච, නාමසද්දා ච'මාදිකො--

---

ඔවුන්අතුරෙන් මෙහි ද්‍රව්‍යශබ්දයා හොරෙනැයි දතයුතු--හිශබ්දයතෙමේ දෙකතකාර්ථ නිපාත යෙකි--උක්තමැනු--

දල්හීයං දළ්හීකරණං; ජෝතකඤ්ච තිධා මතං
දල්හියං පුබ්බවචනං, දල්හීකරණ පච්ඡිමං--

හිසද්දො ජෝතකො වුත්තො. පච්ඡිමත්ථොව ජෝතකො
සාමත්ථෙනෙව පුබ්බත්ථො, වෙදිතබ්බො විභාවිනා--යි

(මෙසේ පඤ්චවිධශබ්දයන්අතුරෙහි සුද්ධසුපරිද්දෙන් සම්භෘතිතභාවය සාමාන්‍යවශයෙන් කියා දැන් ඒ පඤ්චවිධශබ්දයන්අතුරෙහි සංග්‍රහකටයුතු ශබ්දයන් විශෙෂවශයෙන් දක්වන්නාවූ මේ අවාය්‍යතෙමේ "කොලිතො" යන ආදිය කිය)

6 කොලිතො, කොලිතශබ්දයද; උපතිස්සොච, උපතිස්සශබ්දයද; අනඤ්ඤො, අනඤ්ඤශබ්දයද; බකුලො, බකුලශබ්දයද; භගු, භගුශබ්දයද; කොණ්ඩඤ්ඤො, කොණ්ඩඤ්ඤ ශබ්දයද; යඤ්ඤදත්තොච, යඤ්ඤදත්තශබ්දයද; (යන) එවමාදිකො, මේආදියතෙමේ, නාමසද්දා, නාමශබ්දනම් වේ--

("කොලිතො ඉති නාමං යස්ස සො කොලිතො" කොලිතො ඉති, කොලිතො යන, නාමං, නාමය; යස්ස, යමෙකුගේද; සො, හේතෙමේ; කොලිතො, කොලිතනම්--සෙසු නාමයන්හිදු මෙම ක්‍රමය වේ--'**නාමස**' යනු නාමස්වභාවයෙන් යුක්තවූ ක්‍රියසංඥයයි නැගේ--කෙසේද? **චිත්‍ර** යනු නාමශබ්දයි එයින් යුක්තවූ ජනතෙමේද '**චිත්‍ර**' යයි ව්‍යවහාර කරනුලැබේ--උක්තමැනු--

නාමරූපෙන සංයුත්තො, ක්‍රියාව් සඤ්ඤිති ගම්‍යතෙ
නාමො ඉති ආර්ථ විත්තො, සඤ්ඤසද්දොච හොති හි--යි

"ආදියනිනි ආදි" ආදියති ඉති, ගන්නාලැබේ නුයි; ආදි, ආදිනාම් -ආදිශබ්දයතෙම මයහීාද ප්‍රකාර සමීප අවයවාර්ථයන්හි පැලෙන්--මිසහීාදනම් "**සබ්බනාදි**" යන ආදියයි--ප්‍රකාරනම්

——•◆•——

7 මහිසො හත්ථී අස්සොච, මනුස්සො පුරිසො පිච
ඉත්ථී දෙවොච බ්‍රහ්මාච, ජාතිසද්දොච මාදිකො—

8 විසාණී වීණාවී සිඛී, දණ්ඩී දාමී ජතානී ධජී
මුග්ගරී මුසලී මාලී, දබ්බසද්දෙච මාදිකො—

---

'බ්‍රාහ්මණාදයො භුඤ්ජන්ති'' යන ආදියයි--සමීපනම් ''දක්ඛිණොජනමත්ථසාදි'' යන ආදියයි--අවයවනම් ''මූලං රුක්ඛස්සාදි'' යන ආදියයි— උක්තමැනු—

මරියාදෙ පකාරෙච, සමීපෙ වයවෙපිච
චතුබ්බිධප්පකාරොය, මාදිසද්දස්ස ලබ්භතෙ—යි

ඔවුන් අතුරෙන් මෙහි මයර්‍යාදාර්ථයෙහි වේ--ආදිශබ්දයෙන් අඟහස්සාවකාදි ශබ්දයන් ගැණේ)

(මෙසේ දෙවදත්තශබ්දයෙහි සංග්‍රහවූ නාමශබ්දය දක්වා දැන් ජාතිශබ්දයෙහි සඞ්ග්‍රහය දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ ''මහිසො'' යන ආදිය කිය)

7 මහිසො, මහිසශබ්දයද; හත්ථී, හත්ථිශබ්දයද; අස්සො ච, අස්සශබ්දයද; මනුස්සො, මනුස්සශබ්දයද; පුරිසො අපිච, පුරිසශබ්දයද; ඉත්ථී, ඉත්ථිශබ්දයද; දෙවොච, දෙවශබ්දයද; බ්‍රහ්මාච, බ්‍රහ්මශබ්දයද; (යන) එවං ආදිකො, මේ ආදිශබ්දයතෙම; ජාතිසද්දො, ජාතිශබ්දනම් වේ—

(ජාතිනම් වෙන්වෙන්වූ නීලාදිද්‍රව්‍යයෙහි යම් වෙන්නුවූ බුද්ධියෙක් ඒද යම් වෙන්නුවූ ශබ්දයෙක් වේද හෝම ජාතියයි දතයුත්තිය— උක්තමැනු—

භින්නෙසු යෙසු හිය්‍ය ධීසද්දො, සබ්බභෙදිසු යො සමෙ
සාච ජාතිති විඤ්ඤෙය්‍යා, මාලා සුත්තං ඉවන්විතා—යි

(මෙසේ ගොශබ්දයෙහි සඞ්ග්‍රහවූ ජාතිශබ්දය දක්වා දැන් ද්‍රව්‍යශබ්දයෙහි සඞ්ග්‍රහය දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ ''විසාණී'' යන ආදිය කිය)

8 විසාණී, විසාණීශබ්දය; වීණාවී, වීණාවීශබ්දය; සිඛී, සිඛීශබ්දය; දණ්ඩී, දණ්ඩීශබ්දය දාමී, දාමීශබ්දය; ජතානී, ජතානීය

——•❀•——

9 භුඤ්ජකො පිවකොචාථ, කාරකො පොසකො පිච
ඩාසකො වාජකො චාපි, ක්‍රියාසද්දාච මාදිකො—

---

බ්දය; ධජී, ධජීශබ්දය; මුගගරී, මුගගරීශබ්දය; මුසලී, මුසලීශබ්දය; මාලී, මාලීශබ්දය; (යන) එවං ආදිකො, මේ ආදි ශබ්දයතෙම; දබ්බසද්දා, ද්‍රව්‍යශබ්දනම් වේ—

("විසාණං එතස්ස අත්ථීති විසාණී" විසාණං, අග; එතස්ස, මොහට; අත්ථි ඉති, ඇත්තේනුයි; විසාණී, විසාණීනම්—"වීණා එතස්ස අත්ථීති වීණාවී" වීණා, වීණාතොමෝ; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; වීණාවී, වීණාවීනම්—"සිඛා එතස්ස අත්ථීති සිඛී" සිඛා, ශිඛාතොමෝ; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි, සිඛී, සිඛීනාම්—"දණ්ඩො එතස්ස අත්ථීති දණ්ඩී" දණ්ඩං, දණ්ඩතෙම; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; දණ්ඩී, දණ්ඩීනම්—"දාමා එතස්ස අත්ථීති දාමී" දාමා, දම; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; දාමී, දාමීනම්—"ජටානං එතස්ස අත්ථීති ජටානී" ජටානං, කුඩය; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; ජටානී, ජටානීනම්—"ධජො එතස්ස අත්ථීති ධජී" ධජො, ධ්වජයතෙම; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; ධජී, ධජීනම්—"මුගගරං එතස්ස අත්ථීති මුගගරී" මුගගරං, මුගුර; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; මුගගරී, මුගගරීනම්—"මුසලං එතස්ස අත්ථීති මුසලී" මුසලං, මොහොල; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; මුසලී, මුසලීනම්—"මාලා එතස්ස අත්ථීති මාලී" මාලා, මාලාතොමෝ; එතස්ස, මෝහට; අත්ථි ඉති, ඇත්තේනුයි; මාලී, මාලීනම්—විශෙෂණපදයෙන් යම් යම් පදයෙක් වෙසෙසනුලැබේද ඒ ඒ විශෙෂ්‍යපදයතෙමේ ද්‍රව්‍යනම් වේ—උකතාමැනු—

යං යං විසෙස්සතෙ කිඤ්චි, තං තං දබ්බන්ති සඤ්ඤිතං
ජාතාදිපි තතො දබ්බං, ගොතෙව ඉති ලබ්භතෙ—සී

(මෙසේ දණ්ඩශබ්දයෙහි සඞ්ග්‍රහව දක්වා දැන් ක්‍රියාසඞ්ග්‍රහය දක්වන්නාවූ මේ අවාගාථතෙමේ "ඤ්ජකො" යනාදිය කය)

9 භුඤ්ජකො, භුඤ්ජකශබ්දයද; පිවකොච, පිවකශබ්දය

10 කණ්හං සෙතං රත්තොදාතං, නීලං පීතං පභස්සරං
මඤ්ජෙට්ඨං පණ්ඩරං සණ්හං, ගුණසද්දාව මාදිකො—

ද; අපි, නැවත; කාරකො, කාරකශබ්දයද; පොසකො අපි ච, පොසකශබ්දයද; වාසකො, වාසකශබ්දයද; වාජකොච අපි, වාජකශබ්දයද(යන) එවමාදිකො, මේ ආදිශබ්දයතෙම; ක්‍රියාසද්දො, ක්‍රියාශබ්දනම් වේ—

("භුඤ්ජතීති භුඤ්ජකො" භුඤ්ජති ඉති, අනුභව කෙරේනුයි; භුඤ්ජකො, භුඤ්ජකනම්—"පිවතීති පිවකො" පිවති ඉති, බොන්නුයි; පිවකො, පිවකනම් - "කරෝතීති කාරකො" කරෝති ඉති, කෙරේනුයි; කාරකො, කාරකනම්—"පොසෙතීති පොසකො" පොසෙති ඉති, පෝෂණය කෙරේනුයි; පොසකො, පොසකනම්—"වසතීති වාසකො" වසති ඉති, වෙසේනුයි; වාසකො, වාසකනම්—'වජතීති වාජකො' වජති ඉති, යේනුයි; වාජකො, වාජකනම්—අපි යනු උපසංහාපෙක්ඛකයි—ච යනු සමුච්චයයි—නිපාතසමුදායයෙක්හෝ වේ—වා පි; යනුද මෙසේයි—ක්‍රියා නම් ද්‍රව්‍යනුඞු කර්තෘකර්මස්ථවූ කාරකයන් වසින් සිද්ධකටයුතුවූ පදාර්ථයි—උක්තමැනු—

අද්දබ්බභූතං තත්ථාදි, කාරකග්ගාමසාධියං
පදත්ථං කත්තුකම්මට්ඨං, ක්‍රිය මිච්ඡන්ති තබ්බිදූ—යි

(දැන් පාචකශබ්දයෙහි සඞ්ග්‍රහවූ ක්‍රියාශබ්දය දක්වා දැන් ගුණශබ්දයෙහි සඞ්ග්‍රහය දක්වන්නාවූ මේආචාර්‍ය්‍යතෙමේ "**කණ්හං**" යනාදිය කිය)

10 කණ්හං, කණ්හශබ්දය; සෙතං, සෙතශබ්දය; රත්ත, රත්තශබ්දය; ඔදාතං, ඔදාතශබ්දය; නීලං, නීලශබ්දය; පීතං, පීතශබ්දය; පභස්සරං, පභස්සරශබ්දය; මඤ්ජෙට්ඨං, මඤ්ජෙට්ඨශබ්දය; පණ්ඩරං, පණ්ඩරශබ්දය; සණ්හං, සණ්හශබ්දය; (යන) එවමාදිකො, මේ ආදිශබ්දයතෙම; ගුණසද්දො, ගුණශබ්දනම් වේ—

(ගුණනම් ද්‍රව්‍යාශ්‍රිතවූ ද්‍රව්‍යයෙන් අන්‍යවූ ද්‍රව්‍යයාගේ දැනගැනීමට හේතුවූ පෙරලෙන සුලුවූ ගුණරූපිතාදියි - උපාදා පැදු -

11 දෙවදත්තාදිකො නාම, සද්දෙ නාමංච කාරණං
කත්වා වදති නාමස්සා, ධාරං දබ්බන්ති මඤ්ඤතෙ—

12 ගොදිකො ජාතිසද්දොච, කත්වා ජාතිංච කාරණං
වදති ජාතියා ධාරං, දබ්බඤ්චාති ඤායතෙ—

---

දබ්බස්සයො තතො භින්නො, තස්සෙව ගම්‍යහෙතුකො
විපරාවත්ති ධම්මොච, නිග්ගුණො ගුණවිවජ්ජිතො—යී)

(මෙසේ නාමාදිශබ්දයෙහි සඞ්ග්‍රහ කටයුතුවූ නාමාදිශබ්දය දක්වා දැන් දෙවදත්තාදි නාමශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තද (මේශබ්දයතෙමේ මේනාමය කියයන) වාච්‍යයද දක්වන්නාවූ මේආචාර්‍ය්‍යතෙමේ **'දෙවදත්තාදිකො'** යන ආදිය කිය)

11 දෙවදත්තාදිකො, දෙවදත්තාදිවූ; නාමසද්දො, (සංඥා වාචකවූ) නාමශබ්දයතෙම; නාමං එව, නාමයම; කාරණං කත්වා (ප්‍රවෘත්ති) නිමිත්ත කොට; නාමස්ස, නාමයට; ආධාරං, ආධාරවූ; දබ්බං, ද්‍රව්‍යය; වදති ඉති, කියායයි; මඤ්ඤතෙ, දන්නාලැබේ—

(මෙසේ දෙවදත්තාදි නාමශබ්දයාගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වා දැන් ගොශබ්දාදි ජාතිශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ "**ගොදිකො**" යන ආදිය කිය)

12 ගොආදිකො, ගො යන ආදිවූ; ජාතිසද්දොච, ජාතිශබ්දයද; ජාතිංඑව, ජාතියම; කාරණංකත්වා, (ප්‍රවෘත්ති) නිමිත්ත කොට; ජාතියා, ජාතියට; ආධාරං, ආධාරවූ; දබ්බංඑව, ද්‍රව්‍යයම; වදති ඉති, කියායයි; ඤායතෙ, හැඟේ—

(මෙසේ ගො ආදි ජාතිශබ්දයාගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වා දැන් දණ්ඩාදි ද්‍රව්‍යශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ "**දණ්ඩාදි**" යන ආදිය කිය)

13 දණ්ඩාදිදබ්බසද්දෙච, දණ්ඩාදිදබ්බ කාරණං
කත්වා වදති දබ්බස්සා, ධාරං දබ්බන්ති මඤ්ඤතෙ—

14 පාචකාදි ක්‍රියාසද්දෙ, ක්‍රියං කත්වාන කාරණං
වදති ක්‍රියායා ධාරං, දබ්බඤ්ඤෙවාති ඤායතෙ—

15 සුක්කාදි ගුණසද්දෙච, ගුණං කත්වාන කාරණං
වදති ගුණස්සාධාරං, දබ්බඤ්ඤෙවාති ඤායතෙ—

---

13 දණ්ඩාදි, දණ්ඩාදිවූ; දබ්බසද්දෙච, ද්‍රව්‍යශබ්දයතෙමේද; දණ්ඩාදිදබ්බං, දණ්ඩාදි ද්‍රව්‍යය; කාරණංකත්වා, (ප්‍රවෘත්ති) නිමිත්තකොට; දබ්බස්ස, ද්‍රව්‍යයට; ආධාරං, ආධාරවූ; දබ්බං, ද්‍රව්‍යය; වදති ඉති, කියායයි; මඤ්ඤතෙ, හැඟේ—

(මෙසේ දණ්ඩාදි ද්‍රව්‍යශබ්දයාගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වා දැන් පාචකාදික්‍රියාශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ ''**පාචකාදි**'' යන ආදිය කිය)

14 පාචකාදි, පාචකාදිවූ; ක්‍රියාසද්දෙ, ක්‍රියාශබ්දයතෙමේ; ක්‍රියං, (ගමනපචනාදි) ක්‍රියාව, කාරණංකත්වාන, (ප්‍රවෘත්ති) නිමිත්ත කොට; ක්‍රියාය, ක්‍රියාවට; ආධාරං, ආධාරවූ; දබ්බංඑව, ද්‍රව්‍යයම; වදතිඉති, කියායයි; ඤායතෙ, හැඟේ—

(මෙසේ පාචකාදි ක්‍රියාශබ්දයාගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වා දැන් සුක්කාදිගුණශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වන්නාවූ මේ ආචාර්‍ය්‍යතෙමේ '**සුක්කාදි**' යන් ආදිය කිය)

15 සුක්කාදි, සුක්කාදිවූ; ගුණසද්දෙච, ගුණශබ්දයතෙමේද; ගුණං, (නීලපීතාදි) ගුණය; කාරණං කත්වා, (ප්‍රවෘත්ති)නිමිත්ත කොට; ගුණස්ස, (නීලපීතාදි) ගුණයට; ආධාරං, ආධාරවූ; දබ්බංඑව, (පටාදි) ද්‍රව්‍යයම; වදතිඉති, කියායයි; ඤායතෙ, හැඟේ—

(මෙසේ නාමාදිවූ පඤ්චශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වා දැන් නාමශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තා [illegible] **තතකාමෙපඤ්ඤත්ති**'' යන චොදනාව මෙතෙන් සෙ—

16 ඊරිතෙ නාමසද්දානං, නාමජාති සරූපතො
වුත්තෙ නාමෙ නාම ජාති, දබ්බෙ නාමං නිමිත්තකං—

17 පවුත්තෙ නාමසද්දානං, සඤ්ඤිදබ්බෙ සරූපතො
සම්බන්ධො වා තථා නාමං, නිමිත්තන්‍යපි සංසරෙ—

---

පටිහරණීය භිරම්වශයෙන් අභිනවූ ප්‍රවෘත්තිනිමිත්තක් වේ මයයි දක්වන්නාවූ මේ අවසානයෙහි 'බුද්ධිසං' යන ආදිය යි)

16 නාමසද්දානං, නාමශබ්දයන්විසින්; නාමජාති, නාමජාතිය; ඊරිතෙ, කියනලදකල්හි; සරූපතො, ස්වරූපයද; නාමෙ, නාමය; වුත්තෙ, කියනලදකල්හි; නාමජාති, නාමජාතියද; දබ්බෙ, ද්‍රව්‍යයකියනලදකල්හි; නාමං, නාමයද; නිමිත්තකං, නිමිත්තනාම වේ—

('නාමජාතං' යන පදය 'ඊරිතං' යන ක්‍රියාපදයට උක්ත කර්මනම් 'නාමසද්දානං' යන පදය ඕහට කර්තෘනාම් -'ඡට්ඨීච' යනාදූනුයෙන ෂෂ්ඨිවිභක්ති වේ—උක්තමැනු—

අජ්ඣිතෙ කම්මනි යොයං, පඨමා සාධ්‍ය කත්තුනා
තතියා වා ඡට්ඨී, කත්තරි සබ්බදා සියා—ති

(නාමශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්ත මේ තුණම නොවේ ඉන් බිනවූ අන්‍යයෝද ඇත්තාහුමයයි දක්වන්නේ "පවුත්තෙ" යන ආදිය කිය)

17 නාමසද්දානං, (දෙවදත්තාදි) නාමශබ්දයන්විසින්; සඤ්ඤිදබ්බෙ, සංඥිද්‍රව්‍යය; පවුත්තෙ, කීකල්හි; සරූපතො වා, ස්වරූපයහෝ; සම්බන්ධො වා, සම්බන්ධයහෝ; තථා, එසේම; නාමං වා, නාමයහෝ; නිමිත්තං ඉති අපි, නිමිත්තයයිද; සංසරෙ, කීයත්—

("සඤ්ඤා එතස්ස අත්ථීති සඤ්ඤී" සඤ්ඤා, සංඥතොමෝ; එතස්ස, මොහට; අත්ථි ඉති, ඇත්තේනුයි; සඤ්ඤී, සඤ්ඤීනම්- "සම්බන්ධනං සම්බන්ධො" සම්බන්ධනං, සම්බන්ධවීම; සම්බන්ධො, සම්බන්ධනම්—සම්බන්ධ නම් 'දෙවදත්ත' ද්‍රව්‍යයත් හා 'දෙවදත්ත' යන නාමයාගේ එක්වීමයි—දෙවදත්තසම්බන්ධී

——෴——

18 වුත්‍යා ජාතිසද්දානං, ජාත්‍යං රූපං නිමිත්තකං
තථා දබ්බ පවත්තෙනානු, සියා ජාති නිමිත්තකං—

19 දණ්ඩාදිදබ්බසද්දානං, ජාත්‍යං රූපං පවත්තියං
දබ්බ පවත්තෙනානු සම්බන්ධො, දබ්බං ජාතිනිමිත්තකං—

---

ද්‍රව්‍යයද දෙවදත්ත යන නාමය සම්බන්ධිද්‍රව්‍යයද නිශ්‍රිතද්‍රව්‍ය රූපයෙන් නොදක්ම අනුමානවශයෙන්ම දතයුතු—කිසි දිය ශූන්‍ය වස්තුවක් රජතෙම දේ රාජපුරුෂතෙම ගණී දැනකියා ග්‍රහණක්‍රියාවය නිශ්‍රය කොට රාජපුරුෂතෙමේ මේ රජහුහා සම්බන්ධයයි අනුමානවශයෙන් දතයුතුමෙනි—උක්තමිනු--

සම්බන්ධො කාරකෙහෙසො ක්‍රියාකාරකසම්භවො
සම්බන්ධී බුද්ධිජනකො, සම්බන්ධිමය නිස්සිතො—

සම්බන්ධී විය සම්බන්ධො, රූපතො න කුදාචනං
අට්ඨුංසකෙනාපි විඤ්ඤෙය්‍යෙ, මත්‍යතෙ සො නුමානතො—

* රාජා දදාති ගණ්හාති, පරිසොති පවත්තති
ක්‍රියං නිස්සාය සම්බන්ධො, අයං සෙස්සපෙක්ඛලක්ඛණො-ති

(මෙසේ නාමශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වා දැන් ජාතිශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වන්නේ "ඛුජ්ජිංසාජාති" යන ආදිය කිය)

18 ජාතිසද්දානං, ජාතිශබ්දයන්විසින්; ජාත්‍යං, ජාතිය; වුත්තියං, සිතල්හි; රූපං, රූපය; නිමිත්තකං, නිමිත්තනාමි—තථා, එසේම; දබ්බ, ද්‍රව්‍යය; පවත්තෙනානු, සිතල්හිවිනාගී; ජාති, ජාතිය; නිමිත්තකං සියා, නිමිත්තනාම් වන්නේය—

(මෙසේ ජාතිශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වා දැන් ද්‍රව්‍යශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යය දක්වන්නේ "දණ්ඩාදි" යන ආදිය කිය)

19 දණ්ඩාදිදබ්බසද්දානං, දණ්ඩාදිද්‍රව්‍යශබ්දයන්විසින්; ජාත්‍යං, ජාතිය; පවත්තියං, සිතල්හි; රූපං, රූපය නිමිත්තනාම් වේ; දබ්බ, ද්‍රව්‍යය; වූතෙනානු, සිතල්නිවිනාගී; සම්බන්ධී (වා), සම්බන්ධයගෝ; දබ්බං, ද්‍රව්‍යයගෝ; ජාති, ජාතියගෝ; නිමිත්තකං, නිමිත්තනාම් වේ—

20 වුත්තියං ක්‍රියසද්දානං, ජාත්‍යං රූපං ක්‍රියායතු
ජාතිදබ්බ ක්‍රියාවුත්තෙ, සම්බන්ධොවා නිමිත්තකං—

21 වුත්තියං ගුණසද්දානං, ගුණජාත්‍යං සරූපකං
වුත්තෙතු ගුණෝ ගුණජාති, දබ්බෙ ගුණෝ නිමිත්තකං—

---

(මෙහි ගාථා බන්ධනවශයෙන්හෝ ගම්‍යමාන වශයෙන් හෝ වාශබ්දයහා යෙදුනේ වේ)

(මෙසේ ද්‍රව්‍යශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තද වාච්‍යයද දක්වා දූන් ක්‍රියාශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වන්නේ "**වුත්තියංක්‍රිය**" යන ආදිය කිය)

20 ක්‍රියසද්දානං, ක්‍රියාශබ්දයන්විසින්; ජාත්‍යං, ජාතිය; වුත්තියං, කිකල්හි; රූපං, රූපය; නිමිත්තකං, නිමිත්ත වේ; දබ්බ, ද්‍රව්‍යය; වුත්තෙ, කිකල්හි; ජාතිවා, ජාතියහෝ ක්‍රියා, ක්‍රියාව හෝ; සම්බන්ධො, සම්බන්ධයහෝ නිමිත්ත වේ—

(මෙසේ ක්‍රියාශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වා දූන් ගුණශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද දක්වන්නේ '**වුත්තියංගුණ**' යන ආදිය කිය)

21 ගුණසද්දානං, ගුණශබ්දයන්විසින්; ගුණජාත්‍යං, ගුණජාතිය; වුත්තියං, කිකල්හි; සරූපකං, ස්වරූපයද; ගුණෝ, ගුණය; වුත්තෙ, කිකල්හි; ගුණජාති, ගුණජාතියද; දබ්බෙ, ද්‍රව්‍යකිකල්හි; ගුණෝ; ගුණයද; නිමිත්තකං, නිමිත්ත වන්නේය—

(සුක්ලශබ්දයන්විසින් ශුක්ලසාමාන්‍යය කිකල්හි ස්වරූපය නිමිත්ත වේ—'ගොස්ස සුක්කො' යන ප්‍රයොගයෙහි සුක්ක ශබ්දයෙන් ගොද්‍රව්‍යයෙහි සිටි ශුක්ලගුණය කියනලදකල්හි සාමාන්‍යසඞ්ඛ්‍යාත ගුණජාතිය නිමිත්ත වේ—'සුක්කො ගො' යන ප්‍රයොගයෙහිවනාහී ගොද්‍රව්‍යය කියනලදකල්හි ශුක්ලාදි ගුණය නිමිත්ත වේ යනු අභිප්‍රායයි)

(මෙසේ ගුණශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්තද වාච්‍යයද ද

——•◦◦:◦◦•——

22 වුත්තියං ජිනාගහත්ථාදි, සමාසානම්පි ජාතියං
රූපං දබ්බ ච සම්බන්ධො, දබ්බං ජාති නිමිත්තකං—

23 යට්ඨිං පවෙසය තත්‍රෙදං, යට්ඨාදිනො රවිස්සතු
වුත්තෙත දබ්බන්තරෙ දබ්බං, සම්බන්ධොවා නිමිත්තකං—

---

ක්වා දැන් සමාසශබ්දප්‍රවෘත්තිනිමිත්ත දක්වන්නේ '**වුත්තියං ජින්නගහත්ථාදි**' යන ආදිය කිය)

22 ජිනාගහත්ථාදි සමාසානං අපි; ජිනාගහත්ථාදිසමාසයන් විසින්ද; ජාතියං, ජාතිය; වුත්තියං, කීකල්හි; රූපං, රූපයද; දබ්බෙච, ද්‍රව්‍යයකීකල්හිද්; සම්බන්ධො (වා) සම්බන්ධය හෝ; දබ්බං, ද්‍රව්‍යයහෝ; ජාති, ජාතියහෝ; නිමිත්තකං, නිමිත්ත වේ—

(''ජිනාගහනෝ'' යන ප්‍රයොගයෙහි ජිනාගහත්ථශබ්දය විසින් අනියමවශයෙන් කියනලද කල්හි ශෘතිසඞ්ඛ්‍යාත රූපය නිමිත්ත වේ—සිඳිනලද අත්ඇති පුරුෂද්‍රව්‍යය කීකල්හි සිඳින ලද අත්ඇති පුරුෂද්‍රව්‍යයාගේ සම්බන්ධය හෝ සාමාන්‍යස ඞ්ඛ්‍යාත ද්‍රව්‍යය හෝ ජාතිය හෝ නිමිත්ත වේ යනු අභිප්‍රායයි- අපිශබ්දයතෙම සම්භාවනා ගර්හා අපෙක්ෂා සමුච්චය ප්‍රශ්න සංවරණාදියෙහි පැනේ—''සිණෙරුම්පි ඡජ්ජෙය්‍ය'' යන ආදියෙහි සම්භාවනයෙහි පැනේ—බ්‍රාහ්මණගොතෙන සතිපි ගාවො හනති සො ජනො'' යන ආදියෙහි ගර්හාවෙහි පැනේ- ''අයම්පි ධම්මො අනියතො'' යන ආදියෙහි අපෙක්ෂාවෙහි පැනේ—''ඉතිපි සො භගවා'' යන ආදියෙහි සමුච්චයෙහි පැනේ—''අපි භන්තෙ පිණ්ඩපාතො ලද්ධො?'' යනා ආදියෙහි ප්‍රශ්නයෙහි පැනේ—උක්තාමැනු—

සම්භාවනෙව ගරහා, පෙක්ඛාසූච සමුච්චයෙ
පඤ්හෙ සංවරණෙ චෙව, අපිසද්දො පවත්තති—යි

(මෙසේ සමාසශබ්දයාගේ ප්‍රවෘත්තිනිමිත්ත දක්වා දැන් උපමාශබ්දයන්ගේ ප්‍රවෘත්තිනිමිත්ත දක්වන්නේ ''**යට්ඨිං**'' යන ආදිය කිය)

23 යට්ඨිං පවෙසය ඉති, යට්ඨිං පවෙසය යන; ආදෙ, මේ

— — ◆ — — —

21 තාසද්දස්සාපි බාහිරෙ, වුත්තෙන දබ්බං නිමිත්තකං
දබ්බෙ වාපි සද්දං නිමිත්තානි විදන්ති හි—

---

ආදි ප්‍රයොගයෙහි; යට්ඨාදිනො, යට්ඨිආදිවූ; රවසඤ්ඤා, ශබ්ද සංඥාව නාහි; දබ්බනාමෙ, ද්‍රව්‍යවිශේෂය, හෙවත් පුරුෂද්‍රව්‍යය; වුත්තෙන, කියල්හි; දබ්බං, (යෂ්ටි) ද්‍රව්‍යය හෝ; සම්බන්ධොවා, සම්බන්ධය හෝ; නිමිත්තකං, නිමිත්ත වේ—

('යට්ඨිං පවෙසය' යන ප්‍රයොගයෙහි යට්ඨිශබ්දයතෙමේ එකාන්තයෙන් යෂ්ටිද්‍රව්‍යයෙහි පවති—එස්වහැසිරිම්වශයෙන් විනාහි පුරුෂද්‍රව්‍යය කියල්හි ද්‍රව්‍යය හෝ යෂ්ටිද්‍රව්‍යයෙන් පුරුෂද්‍රව්‍යයාගේ සම්බන්ධය හෝ නිමිත්ත වේ යනු අභිප්‍රායයි—උපචාරය නම් හෙතුඵල සදෘශ ස්ථාන ස්ථානි ගුණ එකදෙශ සමීප තද්ධර්ම අභෙදෞපචාරවශයෙන් දශප්‍රකාර වේ—හෙතූපචාරනම් "ගුළො සෙම්හො" යන ආදියයි—ඵලොපචාරනම් "සෙම්හො ගුළො" යන ආදියයි—සදෘශොපචාරනම් "සීහො මාණවො" යන ආදියයි—ස්ථානොපචාරනම් "මඤ්චා ඝොසන්ති" යන ආදියයි—ස්ථාන්‍යුපචාරනම් "කුන්තා පචරන්ති" යන ආදියයි—ගුණොපචාරනම් "නීලො පටො" යන ආදියයි—එකදෙශොපචාරනම් "සමුද්දො මයා දිට්ඨො" යන ආදියයි—සමීපොපචාරනම් "ගඞ්ගායං ඝොසො" යන ආදියයි—තද්ධර්මොපචාරනම් "සසවිසාණං" යන ආදියයි—අභෙදෞපචාරනම් "සනිදස්සනා ධම්මා" යන ආදියයි—උක්තමැනු—

හෙතු ඵලො සදිසොච, ඨානට්ඨානි ගුණො පිච
එකදෙසො සමීපොච, තද්ධම්මො භෙදකො පිච—

ගුළො සෙම්හො සෙම්හො ගුළො, සීහොයං මාණවො පිම
මඤ්චා ඝොසන්ති කුන්තා, පචරන්ති යථාක්කමං—

නීලො පටො සමුද්දොච, ගඞ්ගා සසවිසාණකං
සනිදස්සනා ධම්මාති, ඉදං තෙසං නිදස්සනං—යි

මේ දශප්‍රකාර උපචාරයන් අතුරෙන් මේ ස්ථානොපචාරයයි දතයුතු)

(දැන් ඝොෂශබ්දයාගේ ලක්ෂණය කියල්හි ඔහුගේ ප්‍රවෘත්ති නිමිත්ත දක්වන්නේ "ඝොසද්දස්ස" යන ආදිය කීය)

24 ඝොසද්දස්ස අපි, ඝොෂශබ්දයා පිඩාන්ද; බාහිරෙ, (උප

——◦◦◦——

25 මාණවෙ සීහසද්දස්ස, ධූරෙනත දළ්හිං නිමිත්තතො
සූරාදිගුණසාදිසං, දළ්හිබ්‍යං වා නිමිත්තකං —

26 සීහසද්දො නිරොපෙති, සීහත්තං මාණවෙ යදා
අත්ථමත්තං විපල්ලාසං, තදාතත්ථෙව වත්තතෙ —

---

චාරවශයෙන්) බාහ්‍යවූ ම්ලෙච්ඡය; ධූරෙනත, නිකාල්හි; දළ්හිං, ගොද්‍රව්‍යය; නිමිත්තතො, නිමිත්ත වෙ; දළ්හිබ්‍යං, ගොද්‍රව්‍ය යෙහි සිටිනාවූ; සදිසංවා අපි, සමානභාවය හෝ; නිමිත්තකං ඉන්, නිමිත්තයයි; වදන්ති, (ආචාර්‍ය්‍යයෝ) කියත්මය —

(බාලගුණයවූ ගවයාහා සදෘශභාවයෙන් ගොයි උපචාරව ශයෙන් ම්ලෙච්ඡද්‍රව්‍යවිශෙෂයෙහි වේ යනු අභිප්‍රායයි)

(මෙසේ ගොශබ්දයාගේ ප්‍රවෘත්තිනිමිත්ත දක්වා දැන් සීහ ශබ්දයාගේ ප්‍රවෘත්තිනිමිත්ත දක්වන්නේ "**මාණවෙ**" යනා ආදිය කීය)

25 සීහසද්දස්ස, සීහශබ්දයාවිසින්; මාණවෙ, මාණවකයා; ධූරෙනත, නිකාල්හි; දළ්හිං, ද්‍රව්‍යය; නිමිත්තකං, නිමිත්ත වේ; දළ්හිබ්‍යං, ද්‍රව්‍යසම්බන්ධ; සූරාදිගුණසාදිසංවා, සූරාදිගුණය හා සමා නභාවය හෝ; නිමිත්තකං, නිමිත්ත වේ —

(සූරගුණයවූ සිංහයාහා සදෘශභාවයෙන් මාණවක ද්‍රව්‍යවි ශෙෂයෙහි සිංහයයි උපචාරවශයෙන් වේ යනු අභිප්‍රායයි)

(මෙසේ සීහශබ්දයාගේ ප්‍රවෘත්තිනිමිත්ත දක්වා දැන් උප චාරශබ්දයන්ගේ ව්‍යවහාරසඞ්ඛ්‍යාත අර්ථමාත්‍රය විපර්‍ය්‍යාස වේ තමාගේ අර්ථය විපර්‍ය්‍යාස නොවේයයි දක්වන්නාවූ ආචාර්‍ය්‍ය තෙමේ "**සීහසද්දො**" යනා ආදිය කීය)

26 යදා, යම්කාලෙක්හි; සීහසද්දො, සීහශබ්දයතෙම්; සීහ ත්තං, සිංහභාවය; මාණවෙ, තරුණයාකෙරෙහි; නිරොප ති, නගාද; තදා, එකල්හි; අත්ථමත්තං, (ව්‍යවහාර සඞ්ඛ්‍යාත) අර්ථමාත්‍රය; විපල්ලාසං, විපර්‍ය්‍යාසවූයේ; අත්ථෙව එවි, ත මාගේ අර්ථයෙහිම; වත්තතෙ, පවතී —

——෴——

27 යට්ඨිසද්දෙ නිරොපෙති, යට්ඨිදබ්බනතරෙ යදා,
අත්ථමත්තං විපල්ලාසං, තදත්තනෙව වත්තතෙ—

28 මඤ්චසද්දෙ නිරොපෙති, මඤ්චත්තං නිස්සිතෙ යදා,
අත්ථමත්තං විපල්ලාසං, තදත්තනෙව වත්තතෙ—

29 කුන්තසද්දෙ නිරොපෙති, කුන්තත්තං ගාහකෙ යදා,
අත්ථමත්තං විපල්ලාසං, තදත්තනෙව වත්තතෙ—

30 ගොසද්දෙනු නිරොපෙති, ගොත්තංහි අත්තනි යදා,
අත්ථමත්තං විපල්ලාසං, තදත්තනෙව වත්තතෙ—

---

27 යදා, යම්කලෙක්හි; යට්ඨිසද්දෙ, යට්ඨිශබ්දයතෙම; යට්ඨි දබ්බනතරෙ, යෂ්ටිද්‍රව්‍යවිශෙෂයෙහි; නිරොපෙති, නගාද; තදා, එකල්හි; අත්ථමත්තං, (ව්‍යවහාරසඞ්ඛ්‍යාත) අර්ථමාත්‍රය; විපල්ලාසං, විපර්‍ය්‍යාසස්වූයේ; අත්තනෙව එව, තමාගේ අර්ථයෙහිම; වත්තතෙ පවතී—

28 යදා, යම්කලෙක්හි; මඤ්චසද්දෙ, මඤ්චශබ්දයතෙම; මඤ්චත්තං, මඤ්චභාවය; නිස්සිතෙ, නිශ්‍රිතයා කෙරෙහි; නිරොපෙති, නගාද; තදා, එකල්හි; අත්ථමත්තං, අර්ථමාත්‍රය; විපල්ලාසං, විපර්‍ය්‍යාසවූයේ; අත්තනෙව එව, තමාගේ අර්ථයෙහිම වත්තතෙ, පවතී—

29 යදා, යම්කලෙක්හි; කුන්තසද්දෙ, කුන්තශබ්දයතෙම; කුන්තත්තං, කුන්තභාවය; ගාහකෙ, ගන්නහු කෙරෙහි; නිරොපෙති, නගාද; තදා, එකල්හි; අත්ථමත්තං, අර්ථමාත්‍රය; විපල්ලාසං, විපර්‍ය්‍යාසවූයේ; අත්තනෙව එව, තමාගේ අර්ථයෙහිම; වත්තතෙ, පවතී—

30 යදා, යම්කලෙක්හි; ගොසද්දෙනු, ගොශබ්දයතෙම වනාහි; ගොත්තංහි, ගොභවයම; අත්තනි, තමාකෙරෙහි; නිරොපෙති, නගාද; තදා, එකල්හි; අත්ථමත්තං, අර්ථමාත්‍රය; විපල්ලාසං, විපර්‍ය්‍යාසවූයේ; අත්තනෙව එව, තමාගේ අර්ථයෙහිම; වත්තතෙ, පවතී—

(මෙසේ සිංහාදි උපචාරශබ්දයාගේ අර්ථමාත්‍ර විපර්‍ය්‍යාසය

31 යෙන යෙන නිමිත්තෙන, බුද්ධි සද්දො ච වත්තතෙ
තං තං නිමිත්තකං භාව, පච්චයෙන උදීරිතං —

32 පඨමං ජායතෙ ඤාණං, පච්ඡා සද්දො තු ජායතෙ
නාමාදිසු නිමිත්තෙසු, පඤ්චසූති පවුච්චති —

33 ඤාණන්තු දුවිධං හොති, වදතො සුණතො පිච
වදන්තස්සෙවෙත්ථ ඤාණං, ඉච්ඡිතබ්බං විභාවිනා —

---

දක්වා දැන් ප්‍රවෘත්තිනිමිත්තිවූ වාචකශබ්දය දක්වන්නේ '**යෙන**' යන ආදිය කිය)

31 යෙන යෙන නිමිත්තෙන, යම් යම් නිමිත්තක් කරණ කොටගෙණ; බුද්ධි, බුද්ධියද; සද්දො ච, ශබ්දයද; වත්තතෙ, පවතීද; තං තං නිමිත්තකං, ඒ ඒ නිමිත්ත; භාවප්පච්චයෙන, භාවප්‍රත්‍යයෙන්; උදීරිතං, කියනලද්දේය —

(මෙසේ භාවප්‍රත්‍යයාගේ වාචකභාවය දක්වා දැන් යම් යම් නිමිත්තකින් බුද්ධිය හා ශබ්දය පවතිද ඒ ඒ නිමිත්තයන් අතුරෙන් පළමු කොට ඥානයම උපදියයි දක්වනුකැමැත්තේ '**පඨමං**' යන ආදිය කිය)

32 නාමාදිසු, නාමාදිවූ; පඤ්චසු නිමිත්තෙසු, පස්නිමිත්තයන්හි; ඤාණං, ඥානයතෙම; පඨමං, පළමුකොට; ජායතෙ, (ශබ්දප්‍රවෘත්තිනිමිත්ත අනුවග්‍යාස්මේන්ව) උපදී; පච්ඡා, පසුව; සද්දො තු, ශබ්දයතෙමවනාහි; ජායතෙ ඉති, (ශබ්දප්‍රවෘත්තිනිමිත්තිවූ ද්‍රව්‍යාදිඅර්ථයෙහි) උපදියයි; පවුච්චති, කියනු ලැබේ —

(නාමාදි පස්නිමිතිවල අරමුණුකිරීමෙන් පළමු කොට ඥානය උපදී ඒ ඥානයාගේ ඉපැද්මට පසුව නාමාදිනිමිත්තෙහි හෙතුවූ ශබ්දයතෙමේ උපදී යනු භාවයි)

(මෙසේ පළමුකොට ඥානයාගේ ප්‍රවෘත්තිනිමිත්ත දක්වා දැන් ඥානයාගේ ප්‍රභේදය දක්වනුකැමැත්තේ '**ඤාණන්තු**' යන ආදිය කිය)

33 ඤාණන්තු, ඥානයතෙමේවනාහි; වදතොපිච, කියන්නහුගේද; සුණතො අපිච, අසන්නහුගේද (වශයෙන්) දුවිධං

34 ඤාණ ච ජාතාදිකෙ සද්දං, හොති පච්ඡා ගවාදිකෙ
සද්දෙ, ජාතාදිකං වත්වා, ජාතාද්‍යාධාර මාවදෙ—

35 සද්දමෙකංව භාසන්ති, දුවිධා පණ්ඩිතා පන
ගොමිනිසාදිකා සද්දා, රුළ්හාචාපි මුඛ්‍යා පිච—

36. අත්‍වත්ථංච සමානම්පි, රුළ්හිං ගොමිනිසාදිකං
ගන්ධඝසයනාදිකං ක්‍රියං පටිච්ච විසක්ඛතා—

---

හොත්, දෙවැදෑරුම් වේ; එකං, මේදෙවැදෑරුම්ඥනයෙහි; එ දනනසද්දංච, කියන්නාහුගේම; ඤාණං, ඥනයතෙම; විභාවි නා, ප්‍රාඥයාවිසින්; ඉච්ඡිතබ්බං, කැමැතිවියයුත්තේය—

(මෙසේ ඥනයාගේ ප්‍රභෙදය දක්වා දූත් නිමිතෙනම් ඥනය ද ශබ්දයද පවති හේශබ්දයතෙමේද පළමුකොට ජාතාදිය කියා ඉන්පසු ජාතාදිආධාරය කියායයි දක්වනුකැමැත්තේ "ඤාණ ච" යන ආදිය කිය)

34 ඤාණං, ඥනයතෙම; පඨමං, පළමුකොට; ජාතාදිකෙ, ජාතාදීයෙහි; හොති, වේ; පච්ඡා, (ඉන්)පසු; ගවාදිකෙ, ගවාදිශබ්දයෙහි වේ; සද්දෙ, ශබ්දයතෙම; ජාතාදිකං, ජාතිආදිය; වත්වා, කියා; ජාතාද්‍යාධාරං, ජාතිආදියටආධාරපුද්ගලයා; ආවදෙ, කියන්නේය—

(මෙසේ බුද්ධිසඞ්ඛ්‍යාතවූ ඥනප්‍රභෙදය දක්වා දූන් ශබ්දප්‍රභෙදය දක්වනුකැමැත්තේ "**සද්දමෙකං**" යන ආදිය කිය)

35 එනාංඑවසද්දං, එකමශබ්දය; පණ්ඩිතාපන, පණ්ඩිතයෝ වනාහි; දුවිධා, විප්‍රකාරයකින්; භාසන්ති, කියත්; රුළ්හාචඅපි; රූඪිවශයෙන්ද; මුඛ්‍යාඅපිච, මුඛ්‍යවශයෙන්ද; ගොමිනිසාදිකාසද්දා, ගොමිනිසාදිශබ්දයෝ වෙත්—

(ගොමිනිසාදි සියලු ශබ්දයෝ රූඪිමුඛ්‍යවශයෙන් විප්‍රකාර වෙත්)

(මෙසේ එක්ශබ්දය රූඪිමුඛ්‍යවශයෙන් දක්වා දූන් රූඪිනය දක්වන්නේ "**අත්වත්ථංච**" යන ආදිය කිය)

36 ගොමිනිසාදිකං, ගොමිනිසාදිනාමියතෙම; ගන්ධඝසය නාදිකං, යාම්ගීම් හොඳීම්ආදිවූ; ක්‍රියං පටිච්ච, ක්‍රියාවට නිසා; අ.ථ

37 අවත්ථානවසා වුත්තං, මුඛ්‍යං ගොමහිසාදිකං
ගතිභුසයනාදීනං, ක්‍රියං පටිච්ච විඤ්ඤුනා—

38 ජාත්‍යාදීනං ගහෙත්වාන, වදන්ති අපරෙ පන
ගොමහිසාදිකා සද්දා, මුඛ්‍යාව නාව රුළ්හිකා—

---

තං එව සමානං අපි අනවත්ථිවූයේම; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින් රුළ්හි, රූඪිනාමයයි කියනලද්දේය—

(කවරඅර්ථයකින් 'ගො' නම්වේද? "ගච්ඡතීති ගො" ගච්ඡති ඉති, යේනුයී; ගො, ගොනම්—කවරඅර්ථයකින් 'මහිස' නම් වේද? "මහියං සෙතීති මහිසො" මහියං, පොළොවෙහි; සෙති ඉති, හොව්නුයි; මහිසො, මහිසනම්—මෙසේ වචනාර්ථය සඳහා පවත්නෙන් අනවර්ථනම්—එහි 'ගො—මහිසො' යන නාම යන්ගේ ලැබීමට ගමන සයන ක්‍රියාවන්ගේ ව්‍යුත්පත්තිය නිමිත්ත වේ—ප්‍රවෘත්තිනිමිත්තවනාහි ජාත්‍යාදිවශයෙන් පඤ්චප්‍රකාර වේ—උක්තමැනු—

ක්‍රියාබ්‍යුප්පත්තිනිමිත්තං, වෙදිතබ්බං විනාවිනා
ජාත්‍යාදිපඤ්චභේදන්තු, පවත්තිනිමිත්තං මතං—ඊ

(මෙසේ රූඪිනය දක්වා දැන් මුඛ්‍යනය දක්වන්නේ 'අවත්ථා නවසා' යන ආදිය කීය)

37 ගතිභුසයනාදීනං, ගාමීවීම්හොවීමආදිවූ; ක්‍රියං, ක්‍රියාව; පටිච්ච, නිසා; මුඛ්‍යං, මුඛ්‍යවූ; ගොමහිසාදිකං, ගොමහිසාදී නාමයහෙම; අවත්ථානවසා, අවස්ථානවශයෙන්; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින්; වුත්තං, කියනලද්දේය—

(ගවතෙම යනකාලයෙහිද මහිෂතෙම පොළොවෙහි නිද නාකාලයෙහිද අනවර්ථ වේ—ගවතෙම සයනාදිය කරණකාල යෙහිද මහිෂතෙම ගමනාදියකරණකාලයෙහිද රූඪි වේයයි කියනලදී)

(මෙසේ මුඛ්‍යනය දක්වා දැන් කිසිවෙකුන්ගේ මතයෙන් අභෙදය දක්වන්නේ 'ජාත්‍යාදීනං' යන ආදිය කීය)

38 අපරෙ පන, ඇතම් ආචාර්යකෙනෙක්වනාහි; ජාත්‍යාදී

—— ශබ්දය ——

39 සද්දො පුනාපි දුවිධො, සාධ්‍යසාධනභෙදතො
පච්චක්ඛමනුමානානං, සඤ්ඤානම්පි වසෙනව—

40 වාක්‍යෙ නිප්පන්නසඤ්ඤාව, සාධ්‍යසාධනනාමකා
තෙව පච්චක්ඛානුමාන, සඤ්ඤනාමාති දීපිතා—

කං, ජාතිආදිය; ගහෙත්වාන, ගෙණ; ගොමහිසාදිකා, ගොමහිසාදිවූ; සද්දා, ශබ්දයෝ; මුඛතඑව, මුඛයම වෙත්; නවරුළ්හිකා, රූඪිනොවෙත්යයි; වදන්ති, කියත්—

(මෙසේ කිසිවෙකුන්ගේ වාදයෙන් ශබ්දයන්ගේ අභේදය දක්වා දුන් නැවතද ශබ්දප්‍රභේදය දක්වන්නේ 'සද්දො' යනාදිය කිය)

39 සද්දො, ශබ්දයතෙම; පුනාපි, නැවතද; සාධ්‍යසාධනභෙදතො, සාධ්‍යසාධනභේදයෙන්ද; පච්චක්ඛමනුමානානං සඤ්ඤානං, ප්‍රත්‍යක්‍ෂශබ්ද අනුමානශබ්දයන්ගේ; වසෙනවාපි, භේදයෙන්ද; දුවිධො, විප්‍රකාර වේ—

(සාධ්‍යනම් ධාතුඅවස්ථායි-සාධනනම් ප්‍රත්‍යය සහිතඅවස්ථායි)

(මෙසේ විප්‍රකාරබව දක්වා දුන් ඔවුන්ගේ ස්වරූපය දක්වන්නේ 'වාක්‍යෙ' යන ආදිය කිය)

40 වාක්‍යෙ, වාක්‍යයෙහි; නිප්පන්නසඤ්ඤාඑව, නිපන්ශබ්දයෝම; සාධ්‍යසාධනනාමකා, සාධ්‍යසාධනනම් වෙත්; තෙඑව, ඒ වාක්‍යයෙහි නිෂ්පන්නශබ්දයෝම; පච්චක්ඛානුමානසඤ්ඤනාමාති, ප්‍රත්‍යක්‍ෂශබ්දඅනුමානශබ්දයෝනම් වෙත්යයි, දීපිතා, ප්‍රකාශකරණලද්දාහුය—

("පූරෙතීති පූරිසො" යන පදයෙහි 'පූරෙති' යන වාක්‍යපදය 'පූරිසො' යන පදයාගේ සිද්ධියට හේතුභාවයෙන් සාධ්‍යනම්—'පූරිසො' යන පදය සාධනනම්—"පූරෙතීති පූරිසො" යන ප්‍රයොගයෙහිද 'පූරෙති' යන වාක්‍යපදය ඇසීමෙන්ම පූරණාර්ථය දත්නාහෙයින් ප්‍රත්‍යක්‍ෂනම්—'පූරිසො' යන සිද්ධපදය පූරණක්‍රියාවට හේතුභාවයෙන් පූරිසනම්වේයයි අනුමානවශයෙන් දත්නාහෙයින් අනුමානනම්වේයි කියනලදී)

——ඤාණං——

41 ඤාණං පුනපි දුවිධං, සාධ්‍යසාධනභෙදතො
පච්චක්ඛමනුමානානං, ඤාණනාමපි වසෙනවි—

42 සාධෙ‍ය්‍ය‍ච සාධනෙ ජාතං, ඤාණං සාධ්‍යාදිනාමකං
පච්චක්ඛෙ අනුමානෙවා, ඤාණං තංතංචනාමකං—

43 සද්දො පුනාපි දුවිධො, පඤ්ඤත්තිපරමත්ථතො
හොති වණ්ණසමූහොව, පඤ්ඤත්තිසද්දනාමකො—

(මෙසේ සාධ්‍යසාධනවිශයෙන් ස්වරූපය දක්වා දැන් ඔවුන්ගේ භෙදයෙන් ඥානප්‍රභෙදය දක්වන්නේ 'ඤාණං' යන ආදිය කිය)

41 ඤාණං, ඥානයතෙම; පුනපි, නැවතද; සාධ්‍යසාධනභෙදතො, සාධ්‍යසාධනභෙදයෙන්ද; පච්චක්ඛඅනුමානානං ඤාණනං, ප්‍රත්‍යක්ෂඥාන අනුමානඥානයන්ගේ; වසෙනවිඅපි, වශයෙන්ද; දුවිධං, දෙවැදෑරුම් වේ—

(මෙසේ ඥානප්‍රභෙදය දක්වා දැන් ඥානනාමය දක්වනු කැමැත්තේ 'සාධෙ‍ය්‍යවා' යන ආදිය කිය)

42 සාධෙ‍ය්‍යවා, ධාතුඅවස්ථානයෙහිහෝ; සාධනෙ, සප්‍රත්‍යයඅවස්ථානයෙහිහෝ, ජාතං, උපන්නාවූ; ඤාණං, ඥානය; සාධ්‍යාදිනාමකං, සාධ්‍යාදිනම්ඇත්තේය; (සාධ්‍යනම්වේ සාධනනම්වෙසීසේයි) පච්චක්ඛෙ,ප්‍රත්‍යක්ෂයෙහිහෝ; අනුමානෙවා, අනුමානයෙහිහෝ; ඤාණං, (උපන්නාවූ) ඥානය, තංතංනාමකංඑව, ඒඒ නම්ඇත්තේමවේ (ප්‍රත්‍යක්ෂඥානනම්වේ අනුමානඥානනම්වෙසීසේයි)

(මෙසේ ඥානයාගේ නාමය දක්වා දැන් නැවතද ශබ්දප්‍රභෙදයද ඔවුන්ගේ ලක්ෂණයද දක්වනුකැමැත්තේ 'සද්දො' යන ආදිය කිය)

43 සද්දො, ශබ්දයතෙම; පුනාපි, නැවතද; පඤ්ඤත්තිපරමත්ථතො, ප්‍රඥප්තිපරමාර්ථවශයෙන්; දුවිධො,දෙවැදෑරුම් වේ; වණ්ණසමූහොඑව, වර්ණසමූහයතෙමේම, පඤ්ඤත්තිසද්දනාමකො හොති, ප්‍රඥප්තිශබ්දනම් වේ—

44 පරමත්ථසද්දො නාම, වණ්ණෙකෙකොති දීපිතො
විඤ්ඤූනා සද්දසත්ථෙසු, සද්දත්ථසමයඤ්ඤුනා—

44 පරමත්ථසද්දො නාම, පරමාර්ථශබ්දනම්; එකෙකො වණ්ණො ඉති, එකිඑකිවර්ණයවේයයි; සද්දසත්ථෙසු, ශබ්දශාස්ත්‍රයන්හි; සද්දත්ථසමයඤ්ඤුනා, ශබ්දාර්ථාගමදන්නාවූ; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින්; දීපිතො, ප්‍රකාශකරණලද්දේය—

("අත්ථං පකාරෙන ඤාපෙතීති පඤ්ඤත්ති" අත්ථං, අර්ථය; පකාරෙන, ප්‍රකාරයෙන්; ඤාපෙතිඉති, හඟවානුයී; පඤ්ඤත්ති, පඤ්ඤත්තිනම්—කෙසේ හඟවාද? 'පුරිසො' යන අක්ෂරසමූහය තෙම අර්ථය හඟවානුයී ප්‍රඥප්තිනම් වේ—එකිඑකි වර්ණය තෙම අර්ථය හඟවානුයී පරමාර්ථශබ්දනමැයි කියනලදී—ස මහරුවනාහි මෙසේ කියති—එකිඑකිවර්ණයෙහි නාමයෝ දෙදෙනෙක් ලැබෙති කෙසේද? 'පුරිසො' යි කිකල්හි ශ්‍රොත්‍රවිඥානයට අරමුණුවනකාලයෙහි විශෙෂයාගේ අප්‍රකටභාවයෙන් පරමාර්ථශබ්දනම්—මනොවිඥානයට අරමුණුවනකාලයෙහි විශෙෂයාගේ ප්‍රකටභාවයෙන් ප්‍රඥප්තිශබ්දනම්වේ එසට මේ සාධකයි—

නිරුත්තිපටිසම්භිදා, පාළියෙකෙකමක්ඛරං
විසෙසුප්පත්තියානාම, පඤ්ඤත්තිතිපවුච්චති—යි

'පුරිසො' යන පදය වීථිවශයෙන් මෙසේ දතයුතු-

සද්දං පඨමං සොතෙන, තීතං දුතියචෙතසා
නාමං තතියචිත්තෙන, අත්ථං චතුත්ථචෙතසා—

ශබ්දාරම්මණය පළමුකොට ශ්‍රොත්‍රවිඥානයෙන් දනී, ඉකුත් අරමුණ දෙවනසිතින් දනී, නාමශබ්දය තුන්වනසිතින් දනී, අර්ථය සතරවනසිතින් දනී—ශ්‍රොත්‍රවිඥානය පළමුවන සිතය තම්ජනනතදනුවර්තක මනොවිඥානය දෙවනසිතය, නාමප්‍රඥප්තිවිජානන මනොද්වාරය තුන්වනසිතය, නාමප්‍රඥප්තිවිජානන නගබිම්මනොද්වාරය සතරවනසිතයයි දතයුතු—

(මෙසේ ශබ්දයාගේ ප්‍රභෙදය දක්වා දැන් ඥානයාගේ ප්‍රභෙදය දක්වන්නේ 'ඤාණං' යන ආදිය කීය)

45 ඤාණං පුනපි දුවිධං, පඤ්ඤත්තිපරමත්ථතො
පඤ්ඤත්ති පරමත්ථෙසු, ඤාණං තංතංවනාමකං—

46 පුනපි පඤ්චවිධං ඤාණං, නාමාදිසු පවත්තකං
නාමජාතිදබ්බක්‍රියා, ගුණඤාණාන භෙදතො—

47 යථා ඛයාදිකෙ ඤාණං, ඛයඤාණාදිනාමකං
එවං නාමාදිකෙ ඤාණං නාමඤාණාදිනාමකං—

---

45 පුනපි, නැවතද; ඤාණං, ඥානයතෙම; පඤ්ඤත්තිපරමත්ථතො, ප්‍රඥප්ති පරමාර්ථවශයෙන්; දුවිධං, දෙවැදෑරුම්වේ; පඤ්ඤත්තිපරමත්ථෙසු, ප්‍රඥප්තිපරමාර්ථයන්හි, ඤාණං, (උපන්නාවූ) ඥානය; තංතංනාමකංඑව ඒ ඒ නම්ඇත්තේමවේ (ප්‍රඥප්තිඥානනම්ද පරමාර්ථඥානනම්දවෙයිසේයි)

(මෙසේ එක් ඥානප්‍රභෙදයක් දක්වා දූන් නැවතද පඤ්ච ප්‍රකාර ඥානය දක්වන්නේ 'පුනපි' යනා ආදිය කිය)

46 නාමාදිසු, නාමාදියෙහි; පවත්තකං, පැවැත්තාවූ; ඤාණං, ඥානයතෙම; පුනපි, නැවතද; නාම, නාමඥානය; ජාති, ජාතිඥානය; දබ්බ, ද්‍රව්‍යඥානය; ක්‍රියා, ක්‍රියාඥානය; ගුණඤාණානං, ගුණඥානයයනමොවුන්ගේ; භෙදතො, භෙදයෙන්; පඤ්චවිධං, පස්වැදෑරුම් වේ—

(මෙසේ පඤ්චශබ්දයන්හි ශබ්දඥානයාගේ නාමය දක්වා දූන් ඒ ඒ නම්ඇති ශබ්දඥානයට උපමාවක් දක්වන්නේ 'යථා' යනා ආදිය කිය)

47 යථා, යම්සේ; ඛයාදිකෙ, ක්ෂයාදියෙහිවූ; ඤාණං, ඥානය; ඛයඤාණාදිනාමකං, ක්ෂයඥානාදිනම්ඇතිවේද; එවං, එසේම; නාමාදිකෙ, නාමාදිශබ්දයෙහිවූ; ඤාණං, ඥානය; නාමඤාණාදිනාමකං, නාමඥානාදිනම් වේ—

(යම්සේ යම් ඥානයෙක් ක්ෂයය දනිද ඒඥානය ක්ෂයයි කියනලද්දේවේද එසේම යම් ඥානයෙක් නාමාදිශබ්දය දනිද ඒඥානය නාමාදිනම්ඇත්තේ වේයයි කියනලද්දේ වේ—'යථා'යනු උපමාද්‍යොතනාර්ථයෙහිවූ නිපාතයෙකි— උත්තමැනු—

48 දත්තත්තා පන දබ්බස්ස, නාමං සම්බන්ධකො පිවා
රූපං නාමස්ස ජාතිව, නාමජාතක සරූපකං—

---

උපමාසඤ්ඤ විඤ්ඤායං, පදත්ථානනිවුත්තියං
යොගෙ දූනම්හි යෙවෙත්ථ, යථාසද්දො, පවත්තති— යී

උපමානනම් උපමෙයගා සමානබව ප්‍රකාශකෙරේ— උ
කතාවැතු—

උපමානොපමෙය්‍යානං සදිසත්තොපමා මතා
ඉවාදිසද්දො ජොතෙති, උපමානෙ සදිසත්තං—

සාමඤ්ඤෙන ජානෙය්‍ය, උපමෙය්‍යසදිසත්තං
උපමෙය්‍යෙන පධානොව, ඉතරොත්වප්පධානකො—

උපමෙය්‍යං විසෙසෙත්වා, උපමානො නිවත්තති
තෙන සො අප්පධානොව, ඉතරො සත්ථවත්තිතො— යී

මෙපමණකින් "යෙන යෙන නිමිත්තෙන බුද්ධි සද්දො පවත්තතෙ"යන මේ ගාථාවෙන් බුද්ධියගේද ශබ්දයාගේද පැවැත්ම දක්වා දැන් "තං තං නිමිත්තානං භාව,පපඤ්චෙන උදීරිතං" යන පදයෙහි භාවප්‍රත්‍යයවාචකය දක්වන්නේ "දත්තත්තං" යන ආදිය කීය)

48 දබ්බස්සපන, (දත්ත) ද්‍රව්‍යයාගේවනාහි; (භාවො, වීම) දත්තත්තං, දත්තත්තනම්, නාමං, නාමයහෝ; සම්බන්ධකො අපිවා සම්බන්ධයහෝ ලැබේ, නාමස්ස, නාමයාගේ; රූපං, රූපයද; ජාතිව, ජාතියද ලැබේ; නාමජාතක, නාමජාතීයගේ; සරූපකං, ස්වරූපය ලැබේ—

(ඉදින් දත්තශබ්දය ද්‍රව්‍යවාචක වේනම් භාවප්‍රත්‍යයෙන් නාමයහෝ සම්බන්ධයහෝ කියනුලැබේ-ඉදින් දත්තශබ්දය නාමවාචක වේනම් භාවප්‍රත්‍යයෙන් රූපයද ජාතියද කියනුලැබේ—ඉදින් දත්තශබ්දය ජාතිවාචක වේනම් භාවප්‍රත්‍යයෙන් ස්වරූපය කියනුලැබේයයි කියනලදී--'දත්තත්තං'යන පදයෙහි දෙවශබ්දයකට ලොපය දතයුතු--ඒවචනය සැබව සමාසය නම් පදසංක්ෂෙපවශයෙන් ඒකප්‍රකාරය, ශබ්දාර්ථවශයෙන්ද භූතාභූතපවිශයෙන්ද නිත්‍යානිත්‍යවශයෙන්ද විප්‍රකාරය—

——෴——

49 ඉදමෙව නයං කාතුං ජනිතබ්බං විචාරිනා *
භාවප්පච්චය යුත්තෙසු, නාමසද්දෙසු විඤ්ඤුනා—

50 ගොයසා දබ්බසා ජාතියාවා, භාවො ගොත්තනති එත්ථහි
ගොත්තං ගොණරූපංවා, ලබ්භතිති පවුච්චති—

---

ආදිපදලොප මධ්‍යපදලොප උත්තරපදලොපවිශයෙන් නු න්වැදෑරුම් වේ---ශබ්දසමාසනම් “ද්‍රාතො අත්ථො යස්ස සො ශ්‍රුතාතත්ථො” යන ආදියයි—අර්ථසමාසනම් ‘ශ්‍රුතෙතා අත්ථො ශ්‍රුතත්තත්ථො’ යන ආදියයි--ලුත්තසමාසනම් “ගොධනො” යන ආදියයි--අලුත්තසමාසනම් ‘උරසිලොමො’ යන ආදියයී---නිත්‍යසමාසනම් “අසෙසහි යුත්තො රථො අස්සර ථො” යන ආදියයි---අනිත්‍යසමාසනම් ‘රාජපුරිසො’ යන ආදියයි--ආදිපදලොපසමාසනම්“දෙවෙන දත්තො දත්තො’ යන ආදියයි—මධ්‍යපදලොපසමාසනම් “අසෙසහි යුත්තො රථො අස්ස රථො’ යන ආදියයි---උත්තරපදලොප සමාසනම් “උරසි ලොමො’ යන ආදියයි—උක්තාමැනු—

සමාසො පදසඞ්ඛෙප, විසෙසෙනකවිධො එවා
සද්දඅත්ථසමාසෙන, ලුත්තාලුත්තවසෙනවා—

ආදිමජ්ඣුත්තරානම්පි, පදානං ලොපතො තිධා
ගොධනො උරසිලොමො, කුම්භකාරො ඓාරහං
දත්තො අස්සරථො රූපා, මිච්චාදිව යථාකකමං—යී

(මෙසේ භාවප්‍රත්‍යයවාචකය දක්වා දූන් භාවප්‍රත්‍යයෙන් යුක්තවූ නාමයන්හි නය දක්වන්නේ ‘ඉදමෙව’යන ආදිය කිය).

49 භාවප්පච්චය යුත්තෙසු, භාවප්‍රත්‍යයෙන් යුක්තවූ; නාමසද්දෙසු, නාමශබ්දයන්හි; ඉදං එවනයං, මෙම ක්‍රමය; කාතුං, කොට, විචාරිනා විචාරණප්‍රඥාවෙන් යුක්තවූ; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින්; ජනිතබ්බං, දතයුත්තේය—

(මෙසේ නාමශබ්දයෙහි භාවප්‍රත්‍යය වාචකය දක්වා දූන් ජාතිශබ්දයෙහි භාවප්‍රත්‍යය වාචකය දක්වන්නේ “ගොයස” යන ආදිය කිය)

50 ගොයසද බ්බස්ස, ගොද්‍රව්‍යයාගේහෝ; ජාතියාවා (ගො)

---

* විචක්ඛණානි, සබ්බානි

51 ඉදමෙව නයං කත්වා, ජානිතබ්බං විචාරිනා
භාවප්පච්චයයුත්තෙසු, ජාතිසද්දෙසු විඤ්ඤුනා —

52 දණ්ඩිත්තං දණ්ඩදබ්බස්ස, දණ්ඩදබ්බම්පි ජාතිපි
සහචරණසම්බන්ධො, දණ්ඩජාතස්ස සරූපකං —

53 ඉදමෙව නයං කත්වා, ජානිතබ්බං විචාරිනා
භාවප්පච්චයයුත්තෙසු, දබ්බසද්දෙසු විඤ්ඤුනා —

---

ජාතියගේහෝ; භාවො, වීම; ගොත්තංඉති, ගොත්තනම් වෙයි; එත්ථ, මේප්‍රයොගයෙහි වනාහි; ගොජාති, ගොජාතියහෝ; ගොසරූපංවා, ගොස්වරූපයහෝ; ලබ්භතිඉති, ලැබේයයි; පවුච්චති, කියනුලැබේ —

51 භාවප්පච්චයයුත්තෙසු, භාවප්‍රත්‍යයෙන් යුක්තවූ; ජාතිසද්දෙසු, ජාතිශබ්දයන්හි; ඉදංඑවනයං, මෙමනය; කත්වා, කොට; විචාරිනා, විචාරණප්‍රඥාවෙන් යුක්තවූ; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින්; ජානිතබ්බං, දතයුත්තේය —

(මෙසේ ජාතිශබ්දයෙහි භාවප්‍රත්‍යය වාචකය දක්වා දැන් ද්‍රව්‍යශබ්දයෙහි 'භාවප්‍රත්‍යය වාචකය දක්වන්නේ '**දණ්ඩිත්තං**' යන ආදිය කිය)

52 දණ්ඩදබ්බස්ස, දණ්ඩද්‍රව්‍යයාගේ (භාවො, වීම) දණ්ඩිත්තං, දණ්ඩිත්තනම්; දණ්ඩදබ්බංඅපි, දණ්ඩද්‍රව්‍යයද; ජාතිඅපි, (දණ්ඩ) ජාතියද; සහචරණ සම්බන්ධො, එක්වහැසිරීමෙන් සම්බන්ධයද ලැබේ; දණ්ඩජාතස්ස, දණ්ඩජාතියගේ; (භාවො, වීම; දණ්ඩිත්තං, දණ්ඩිත්තනම්) සරූපං, ස්වරූපය ලැබේ —

53 භාවප්පච්චයයුත්තෙසු, භාවප්‍රත්‍යයෙන් යුක්තවූ; දබ්බසද්දෙසු, ද්‍රව්‍යශබ්දයන්හි, ඉදංනයංඑව, මේනයම; කත්වා, කොට; විචාරිනා, විචාරණ ප්‍රඥාවෙන් යුක්තවූ; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින්; ජානිතබ්බං, දතයුත්තේය —

(මෙසේ ද්‍රව්‍යශබ්දයෙහි භාවප්‍රත්‍යයවාචකය දක්වා දැන් ක්‍රියාශබ්දයෙහි භාවප්‍රත්‍යයවාචකය දක්වන්නේ '**පාචකත්තං**' යන ආදිය කිය)

54 පාචකත්තනන්තු දබ්බස්ස, ක්‍රියාසම්බන්ධකොපිවා
ක්‍රියායතු ක්‍රියා ජාති, ක්‍රියාජාත්‍යා සරූපකං —

55 ඉදමෙව නයං කත්වා, ජානිතබ්බං විචාරිනා
භාවප්පච්චය යුත්තෙසු, ක්‍රියාසද්දෙසු විඤ්ඤුනා —

56 සුක්කත්තං පන දබ්බස්ස, ගුණෙ ගුණස්ස ජාතිවා
ගුණජාත්‍යා සරූපංවා, ලබ්භතීති උදීරිතං —

57 ඉදමෙව නයං කත්වා, ජානිතබ්බං විචාරිනා
භාවප්පච්චයයුත්තෙසු, ගුණසද්දෙසු විඤ්ඤුනා —

---

54 දබ්බස්සතු, (පාක) ද්‍රව්‍යයාගේවනාහි; (භාවො, වීම;) පාචකත්තං, පාචකත්තනම්; ක්‍රියා, ක්‍රියාවහෝ; සම්බන්ධකො අපිවා, සම්බන්ධයහෝ ලැබේ; ක්‍රියායතු, (පාක) ක්‍රියාවගේවිනාහි; (භාවො, වීම; පාචකත්තං, පාචකත්තනම්;) ක්‍රියා, ක්‍රියාවද; ජාති, ජාතියද ලැබේ; ක්‍රියාජාත්‍යා, (පාක) ක්‍රියාජාතියගේ; (භාවො, වීම; පාචකත්තං, පාචකත්තනම්) සරූපකං, ස්වරූපය ලැබේ —

55 භාවප්පච්චයයුත්තෙසු, භාවප්‍රත්‍යයෙන් යුක්තවූ; ක්‍රියාසද්දෙසු, ක්‍රියාශබ්දයන්හි; ඉදංනයංඑව, මේනයම; කත්වා, කොට; විචාරිනා, විචාරණප්‍රඥාවෙන් යුක්තවූ; විඤ්ඤුනා, ප්‍රාඥයාවිසින්; ජානිතබ්බං, දතයුත්තේය —

(මෙසේ භාවප්‍රත්‍යයවාචකය දක්වා දැන් ගුණශබ්දයෙහි භාවප්‍රත්‍යයවාචකය දක්වන්නේ 'සුක්කත්තං' යනාදිය කිය)

56 දබ්බස්සපන, (ශුක්ල) ද්‍රව්‍යයාගේවනාහි; (භාවො, වීම) සුක්කත්තං, සුක්කත්තනම්වේ; ගුණෙ; (ශුක්ල) ගුණයහෝ; ගුණස්ස, (ශුක්ල) ගුණයාගේ (භාවො, වීම; සුක්කත්තං, සුක්කත්තනම්) ජාතිවා (ගුණ) ජාතියහෝ; ගුණජාත්‍යා, (ශුක්ල) ගුණ ජාතියගේ; (භාවො, වීම; සුක්කත්තං, සුක්කත්තනම් වේ) සරූපංවා, ස්වරූපයහෝ; ලබ්භතීති, ලැබේයයි; උදීරිතං, කියනලද්දේය —

57 භාවප්පච්චයයුත්තෙසු, භාවප්‍රත්‍යයෙන් යුක්තවූ; ගුණසද්දෙසු, ගුණශබ්දයන්හි; ඉදංඑවනයං, මෙම්නය; කත්වා,

———⁂———

58 සීහත්තං පන දබ්බස්ස, සදිසං සීහදබ්බතං
ඉතරෙස්වපි එසෙව, නයො විඤ්ඤූහි මඤ්ඤතෙ—

---

කොට; විචාරිනා, විචාරණ ප්‍රඥාවෙන් යුක්තවූ; විඤ්ඤූනා, ප්‍රාඥයාවිසින්; ඤාන්තබ්බං, දතයුත්තේය—

(මෙසේ ගුණශබ්දයෙහි භාවප්‍රත්‍යය වාචකය දක්වා දැන් උපචාරශබ්දයෙහි භාවප්‍රත්‍යය වාචකය දක්වන්නේ "සීහත්තං" යන ආදිය කියා)

58 දබ්බස්ස පන, (සිංහ) ද්‍රව්‍යයාගේ වනාහි; (භාවො, වීම) සීහත්තං, සීහත්තනම්; සදිසං, (ස්‍වරූපි) සදෘශයද; සීහදබ්බතං, සිංහද්‍රව්‍යයද ලැබේ; ඉතරෙස්වපි, අනික්ගොත්‍රාදීන්හිද; එසො එවනයො; මෙම්ක්‍රමය; විඤ්ඤූහි, ප්‍රාඥයන්විසින්; මඤ්ඤතෙ; දන්නාලැබේ—

(මෙහි වනාහි භාවශබ්දයෙන් විග්‍රහකරණලද බැවින් භාවතද්ධිතයයි දතයුතු—ඒ එසේමැයි තද්ධිතයනම් සාමාන්‍ය වෘත්තිතද්ධිත භාවතද්ධිත අව්‍යයතද්ධිතවශයෙන් තුන්වැදෑරුම් වේ—භාවතද්ධිතනම් 'අලසස්ස භාවො ආලස්සං' යන ආදියයි--අව්‍යයතද්ධිතනම් "කො පකාරෙ කථං" යන ආදියයි—සාමාන්‍යතද්ධිතනම් මේ විවිධතද්ධිතයන්කෙරෙන් අවශෙෂ තද්ධිතයි---එකම සාමාන්‍යවෘත්තිතද්ධිතයතෙම අපච්චතද්ධිත අනෙකතද්ධිත අස්සත්ථිතද්ධිත සඞ්ඛ්‍යාතද්ධිත වශයෙන් සතර ප්‍රකාර වේ--අපච්චතද්ධිතනම් 'වසිට්ඨස්ස අපච්චං' වාසිට්ඨො යන ආදියයි---අස්සත්ථි තද්ධිතනම් 'සද්ධා එතස්ස අත්ථි තස්මිං වා විජ්ජතීති සද්ධො'' යන ආදියයි--සඞ්ඛ්‍යාතද්ධිතනම් 'සතස්ස විකං වියතං' යන ආදියයි--මේ තුන්වැදෑරුම් තද්ධිතයෙන් අන්‍යවූයේ අනෙකතද්ධිතනම්—උදාහරණ—

සාමඤ්ඤවුත්තිභාවබ්‍යථා, බ්‍යයතො තද්ධිතං තථා
තත්‍රාදි වතුධා පච්ච, නෙකස්සත්ථි සඞ්ඛ්‍යතො—යි

"තෙසං අපච්චාදි අත්ථානං හිතං තද්ධිතං''තෙසං අපච්චාදී අත්ථානං, ඒඅපත්‍යාදි අර්ථයන්ට; හිතං, හිතවූයේ; තද්ධිතං, තද්ධිතනම්--"තෙසං ගොත්තාදිසඤ්ඤානංවා හිතං තද්ධිතං" තෙසං ගොත්තාදිසඤ්ඤානංවා, ඒගොත්‍රාදිශබ්දයන්ටහෝ; හි

—— ——

59 පුරිසාදි රවුප්පත්ති, නිමිත්තං කින්නු භො වදෙ?
ජාතාදීනං කිමත්ථංච, තුව මාචික්ඛ පණ්ඩිත.

60 වාදෙ කෙසඤ්චි නිච්චත්තා, ජාති මුච්චාරිතො රවො
බ්‍රවීති මුඛ්‍යතො රූපං, නිමිත්තානි පවුච්චති.

---

තං, හිතවූයේ; තද්ධිතං, ප්‍රබන්ධනම්--"සවණෙණ අභිප්පෙත්තානං සිස්සානංවා හිතං තද්ධිතං" යන්නෙන්, ශ්‍රවණයෙහි; අභිප්පෙත්තානං, යෙදුනාවූ; සිස්සානංවා; ශිෂ්‍යයන්ටහෝ; හිතං, හිතවූයේ; තද්ධිතං, තද්ධිතනම්--"ජනානං වුඩ්ඩාදිසාධනානංවා හිතං තද්ධිතං" ජනානං වුඩ්ඩාදිසාධනානං වා, ජනයන්ට වෘද්ධ්‍යාදිකාරකයන්ටහෝ; හිතං, හිතවූයේ; තද්ධිතං, තද්ධිතනම්--මෙහි 'තද්ධිතං' යී කිවමනානන්හි හකාරයහට ධකාරද ඕහට චිත්වද කොට 'තද්ධිතං' යී කියනලදී--උක්තඤ්හි--

තෙසං හිතං අපච්චාදි ප්‍රත්‍යානං ඉති තද්ධිතං
තෙසං හිත වා ගොතනාදි සද්දානං ඉති තද්ධිතං.

සවණෙණ අභිප්පෙත්තානං සිස්සානං වාති තද්ධිතං
ජනානං හිතංවා වුඩ්ඩාදි සාධනානන්ති තද්ධිතං
චිත්තබ්බෙ පාකිතනෙතාව, කාථා ධත්තං තපිරිතා--යී

(මෙපණකින් භාවප්‍රත්‍යයවාචකය දක්වා දූන් කාරණාක මූතා පෘච්ඡාවශයෙන් විතාරත්නේ'පුරිසාදි' යන ආදිය කිය)

59 භො, එ පුරිසාදි ශබ්දයතෙම; කිංපුරිසාදිරවුප්පත්තිනි මිත්තං, කිනම් පුරිසාදිශබ්දයන්ගේ ඉපැද්මට නිමිත්තක්; වදෙනු, කියන්නේද; ජාතාදීනං, ජාතිආදින්ගේ; කිංඅත්ථං, කිනම්අර්ථයක් කියන්නේද? පණ්ඩිත, ප්‍රාඥය; තුවං ප්‍රශ්නමන්නෙමේ; ආචික්ඛාහි, කියව.

(මෙසේ විචාරූ දූන් ඇතම් ආචාර්‍යකෙනෙකුන්ගේ මතය දක්වන්නේ "වාදෙ" යන ආදිය කිය)

60 කෙසඤ්චි, ඇතම් ආචාර්‍යකෙනෙකුන්ගේ; වාදෙ, වාදයෙහි; උච්චාරිතො, කියනලද; රවො, ශබ්දයතෙම; නිච්චත්තා, නිත්‍යභාවයෙන්ද; මුඛ්‍යතො, ප්‍රධානභාවයෙන්ද; ජාතිං, ජාතිය; බ්‍රවීති, කියයී; රූපං, ශාතිය; නිමිත්තානංඉති, නිමිත්තයයි; පවුච්චති, කියනුලැබේ.

61 ජාතියා ධාරකත්තාච, නිච්චං ජාත්‍යනුබන්ධකං
දබ්බම්පි වුච්චතෙ සද්දා, නුගතත්තා සරූපකං.

(මෙසේ කිසි ආචාර්‍ය්‍යකෙනෙකුන්ගේ මතය දක්වා හුදෙක් ජාතියම නොකියනලද්දේය ඉක්බිතිව ජාතියට ආධාරවූ ද්‍රව්‍ය යද කියනුලැබේයයි දක්වන්නේ "ජාතියා" යන ආදිය කීය)

61 ජාතියා, ජාතියට; ආධාරකත්තා එව, ආධාරහෙයින්ම; නිච්චං, නිතර; ජාත්‍යනුබන්ධකං, ජාතිය ලුහුබඳින්නාවූ; දබ්බං අපි, ද්‍රව්‍යයද; සද්දානුගතත්තා, ශබ්දානුගතහෙයින්, සරූපකං, ස්වරූපයසී; වුච්චතෙ, කියනුලැබේ.

("ජාතිංඑව අනුබන්ධතීති ජාත්‍යනුබන්ධකං" ජාතිංඑව, ජාතියම; අනුබන්ධකං, ලුහුබඳින්නේ; ජාත්‍යනුබන්ධකං, ජාත්‍යනුබන්ධකනම්—"සද්දං අනුගච්ඡතීති සද්දානුගතං" සද්දං, ශබ්දය; අනුගච්ඡති ඉති, අනුවයේනුයි; සද්දානුගතං, සද්දානුගතනම්—"ජාතියාආධාරකත්තා-සද්දානුගතත්තා" යන පදමය තෙම 'වුච්චතෙ' යන ක්‍රියාපදයට හෙතුයි—හෙතුනාම් ජනක ඥාපක සම්පාපකවශයෙන් ත්‍රිවිධයි ඔවුන්අතුරෙන් මේඥාපකහෙතුයි—එසේම නානා පරම්පර ප්‍රත්‍යක්‍ෂහෙතුවිශයෙන්ද ත්‍රිවිධයි—ඔවුන්අතුරෙන් මේ ප්‍රත්‍යක්‍ෂහෙතුයි. උක්තමැනු.

ජනකො ඤාපකො සම්පා, පකොති හෙතවො තයො
බීජාය ජායතඞ්කුරෙ, ධූමාසග්ගීති ඤායති.

රථෙන නගරං පත්තො, නාවාය පාරං පාපුණි
මග්ගෙන පාපුණී පාරං, ඉදං තෙසං නිදස්සනං.

නානා පරම්පරා චෙව පච්චක්ඛවසතො තිධා
කුසලස්ස කතත්තාච, සම්පන්නත්තා පච්චයස්ස
උප්පන්නං හොති විඤ්ඤාණං වෙදිතබ්බං විභාවිනා.

සීලතො පමුදො හොති, පමුදා හොති සුඛිතො
සුඛිතත්තා පස්සම්භති, කායො යොගස්ස භික්ඛුනො.

ඤාණතො [illegible]චා හොති, සීලතො හොති සුඛිතො
තස්මා ඤාණඤ්ච සීලඤ්ච, [illegible] සදා.

62 අඤ්ඤොපි දබ්බසම්බන්ධා ක්‍රියානාමගුණෙණ අපි
අමුඛ්‍යතො වදෙ ජාත්‍ය, ධාරනිස්සිතභාවතො —

63 දන්තො ගො දණ්ඩී පාචකො, සුක්කොච්චාදී නිදස්සනං
දණ්ඩාදිනා නපෙක්ඛස්ස, ජාති දණ්ඩාදිකෙ වදෙ —

---

(මෙසේ මුඛ්‍යවශයෙන් ජාතිනාමයෝ කියනලද්දිය අමුඛ්‍ය වශයෙන් ද්‍රව්‍යස්වරූපය කියනලද්දේය-මෙසේ අන්‍යයෝද කියනලද්දාහුයයි දක්වන්නේ '**අඤ්ඤොපි**' යන ආදිය කීය)

62 අඤ්ඤොපි, නැවතද; ජාත්‍යාධාරනිස්සිතභාවතො, ජාතියට ආධාරවූ ද්‍රව්‍යනිශ්‍රිතභාවයෙන්; දබ්බසම්බන්ධා, ද්‍රව්‍යසම්බන්ධවූ; ක්‍රියානාමගුණෙණ අපි, ක්‍රියානාමගුණයන්ද; අමුඛ්‍යතො, අප්‍රධානවශයෙන්; වදෙ, කියන්නේය —

